මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

மொறட்டுவைப் பல்கலைக்கழகம், இலங்கை

UNIVERSITY OF MORATUWA, SRI LANKA



වාර්ෂික වාර්තාව සහ ගිණුම් වාර්තාව

வருடாந்த அறிக்கையுடன் கணக்கறிக்கை

ANNUAL REPORT & STATEMENT OF ACCOUNT

2021

වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන

2021

අපගේ දැක්ම

වඩාත්ම ගෝලීයව පිළිගත් දකුණු ආසියාවෙහි දැනුම් ව්‍යවසාය වීම

අපගේ මෙහෙවර

පහත සඳහන් දෑ තුළින් දකුණු ආසියාව තුළ තාක්ෂණික සහ අදාළ ශික්ෂණයන් සඳහා ප්‍රමුඛ දැනුම් ව්‍යවසාය බවට පත් වීම:

- ගෝලීය අභියෝගවලට මුහුණ දීම සඳහා විමසුම් මනස පෝෂණය කරන සහ දැනුම සහ කුසලතා සංවර්ධනය කරන තාක්ෂණික සහ ආශ්‍රිත ශික්ෂණයන්හි ප්‍රතිසංස්කරණාත්මක අධ්‍යාපනය සැපයීමෙන්;

- දැනුම පිළිබඳ සීමා මායිම් පුළුල් කිරීමට සහ ජාතික තාක්ෂණික හැකියා ඉහළ නැංවීමට ජාතිකව වැදගත් සහ ඉහළ බලපෑම් සහිත පර්යේෂණ කර ගෙන යාමෙන්;

- අන්තර්ජාතිකව ස්ථානගත වූ ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාලයක් ලෙස රජයට, කර්මාන්තයට සහ සමාජයට විශේෂඥ සේවා සැපයීමෙන්; සහ

- ශ්‍රී ලංකාවේ තිරසාර, විද්‍යාත්මක, තාක්ෂණික, සමාජයීය සහ ආර්ථික සංවර්ධනයට දායක වීමෙන්.



මොරටුව විශ්වවිද්‍යාලය (UOM) අද ශ්‍රී ලංකාවේ හොඳම විශ්වවිද්‍යාලවලින් එකක් ලෙස සැලකේ. මොරටුව විශ්වවිද්‍යාලය (UOM) අධ්‍යාපනික වශයෙන් මනා දැනුමින් යුත්, ආත්ම විශ්වාසයෙන් යුත්, නම්‍යශීලී උපාධිය ලැබීමෙන් පසු වහාම සේවයේ යෙදීමට සූදානම් ජාත්‍යන්තරව පිළිගත් ගුණාත්මක උපාධිධාරීන් බිහි කිරීමට කැපවී කටයුතු කරයි. තවද, අපේ ශිෂ්‍යයන් උපාධිය ලබා ගන්නා විට "රැකියා සොයන්නන්" වෙනුවට "රැකියා නිර්මාණකරුවන්" බවට පත් වීමට පුහුණු කෙරේ. අපගේ බොහොමයක් නව උපාධිධාරීන්ගේ වාර්ෂික වැටුපටත් වඩා අඩු මුදලක් වන වසර 4කට එක් ශිෂ්‍යයෙක් සඳහා ඇමෙරිකානු ඩොලර් 9500ක පිරිවැයකින් (පුනරාවර්තන) ඉංජිනේරු, වෛද්‍ය වාස්තු විද්‍යා, ප්‍රමාණ සමීක්ෂණ, සැලසුම්කරණය, නගර හා ග්‍රාම නිර්මාණකරණ, පහසුකම් කළමනාකරණ, තොරතුරු තාක්ෂණ, සහ ප්‍රවාහන සහ කාර්ය සම්පාදන කළමනාකරණ සහ ව්‍යාපාර අංශවල උපාධිධාරීන් මොරටුව විශ්වවිද්‍යාලය බිහි කරයි.

විශ්වවිද්‍යාලය ක්‍රමෝපාය සැලසුම්කරණය සහ බොහෝ මූලාරම්භයන් ක්‍රියාවට නැංවීම මගින් ශ්‍රී ලංකාව "දැනුම් මධ්‍යස්ථානයක්" බවට පත් කිරීමට දායක වන අතරතුර අප රටේ ආර්ථික සංවර්ධනයේදී ක්‍රියාකාරී සහභාගිවන්නෙකු වීමට ඉලක්ක කීපයක් සකසා ඇත.

2021 වසර අවසානය වන විට, මොරටුව විශ්වවිද්‍යාලය තුළ 8917ක් වූ ශිෂ්‍ය ප්‍රජාවක් විය. විශ්වවිද්‍යාලය 2020 උ.පෙ. ශිෂ්‍ය කණ්ඩායමෙන් ශිෂ්‍යයන් 2345ක නව කණ්ඩායමක් බඳවා ගන්නා ලදී (කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් නව බඳවා ගැනීම් 2022 මුල් භාගයේදී සිදු කරන ලදී). එය යම් දැඩි ඉඩකඩ සීමා නොසලකා සිදු කළේ මොරටුව විශ්වවිද්‍යාලය නව බඳවා ගැනීම සඳහා අධ්‍යයන වැඩසටහන් ඇරඹීම සම්බන්ධව අනෙකුත් බොහෝ විශ්වවිද්‍යාලවලට වඩා ඉදිරියෙන් සිටීමින් රැඳී සිටීමේ කාලය අඩු කර ගනිමිනි.

පසුගිය වසර දහය තුළ, විශ්වවිද්‍යාලය වාර්ෂිකව සිසුන් බඳවා ගැනීම 50%කට වඩා වැඩි කර ඇති බව අවධාරණය කළ යුතුය, අපගේ උපාධි වැඩසටහන් සඳහා සිසුන්ගේ සහ ඔවුන්ගේ දෙමාපියන්ගේ වැඩි වන ඉල්ලුම සපුරාලීම සඳහා ඉංජිනේරු පීඨයේ 34%, තොරතුරු තාක්ෂණ පීඨයේ 38% සහ ව්‍යාපාර පීඨයේ 60% ක් වශයෙනි. තවද, UOM තොරතුරු තාක්ෂණ පීඨයේ මෙම වසර තුළදී ආරම්භ කරන ලද කෘත්‍රිම බුද්ධිය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සඳහා සිසුන් 66 දෙනෙකු බඳවා ගන්නා ලදී.

පසුගිය වසර දහයක කාලය තුළ සැලකිය යුතු ලෙස ඉහළ ගිය වාර්ෂික බඳවා ගැනීම් සහ සීමිත පහසුකම් සහිතව, මොරටුව විශ්වවිද්‍යාලය එහි සියලු උපාධිධාරී වැඩසටහන්වල අදාළත්වය හා ගුණාත්මකභාවය අඛණ්ඩව පවත්වා ගැනීමට සහ වැඩිදියුණු කිරීමට සමත් වී ඇත.

2021 වසරේ දී, අවසන් විභාගයට පෙනී සිටි 1551ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව අතුරින් සිසුන් 1441 (93%) දෙනෙක් සිය පළමු උපාධිය හිමි කර ගැනීම සඳහා පනවා ඇති අවම කාල පරිච්ඡේදය තුළ උපාධිය හිමි කර ගත්හ. 2021 වසරේ පොදු උපාධි ප්‍රදානෝත්සවයේ දී පිරිනමන ලද මුළු උපාධි සංඛ්‍යාව 1958ක් වූ අතර එයින් උපාධි 1465ක් ප්‍රථම උපාධි වූ අතර 493ක් පශ්චාත් උපාධි විය.

2021 වසරේ සිදු කළ, උපාධිධාරීන්ගේ සේවානියුක්ති රටාව පිළිබඳ නිරීක්ෂණ සමීක්ෂණයට අනුව, මොරටුව විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් සම්බන්ධව කර්මාන්තය හා එහි සේවායෝජකයගේ විශාල ඉල්ලුමක් කොවිඩ්-19 වසංගත තත්ත්වය තුළදී පවා ඇති බව පෙන්නුම් කරමින්, උපාධි ප්‍රදානෝත්සව අවස්ථාව වන විට සියලු උපාධිධාරීන්ගෙන් 69.4%ක් රැකියාවල නියුක්ත වූ බව වාර්තා විය.

ඒකාබද්ධ උපාධි ආරම්භ කිරීම, ජාත්‍යන්තර සිසුන් ආකර්ෂණය කර ගැනීම, ජාත්‍යන්තර සංචාර සඳහා පහසුකම් සැලසීම, ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල අපගේ සිසුන් ස්ථානගත කිරීම් සඳහා පහසුකම්

සැලසීම, ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම්වලට එළඹීම යනාදී කටයුතු සිදු කරන ලද අතර විශ්වවිද්‍යාලය 2021 වසරේ දී ජාතික හා ජාත්‍යන්තර වශයෙන් බොහෝ ක්ෂේත්‍රවල එහි කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ කාර්ය සාධනය අනුව ලැබුණු පිළිගැනීම් අඛණ්ඩව පවත්වාගෙන ගියේය.

පසුගිය වසර කිහිපය තුළ මොරටුව විශ්වවිද්‍යාලය අත් කරගෙන ඇති ජයග්‍රහණ රජය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සැලකිල්ලට ගනු ඇතැයි ද විශ්වවිද්‍යාලයේ ක්‍රමෝපායික සැලැස්මේ ඉලක්ක හා අරමුණු ඉටු කර ගැනීමට හා **"වඩාත්ම ගෝලීයව පිළිගත් දකුණු ආසියාවෙහි දැනුම් ව්‍යවසාය බවට පත් වීම"** සඳහා වූ එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම පිණිස සහාය වනු ඇතැයි ද අවංකවම බලාපොරොත්තු වෙමි.

මහාචාර්ය එන්.ඩී. ගුණවර්ධන
උපකුලපති
මොරටුව විශ්වවිද්‍යාලය

අන්තර්ගතය

		පිටුව
	ආයතනික ඉලක්ක	i
	පාලක සභාව	ii - iii
	සංවිධාන සැලසුම	iv
1 කොටස	විශ්වවිද්‍යාල ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය	01- 16
2 කොටස	සම්පත් සහ ශිෂ්‍යයන්	
	සාරාංශය (සම්පත් සහ ශිෂ්‍යයන්)	17
	විස්තර (සම්පත් සහ ශිෂ්‍යයන්)	18
3 කොටස	දේශීය ශිෂ්‍යයන්	
	සාරාංශය (දේශීය ශිෂ්‍යයන්)	19 - 20
	විස්තර (දේශීය ශිෂ්‍යයන්)	21 - 25
4 කොටස	විදේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර	26 - 27
5 කොටස	කාර්ය මණ්ඩලයේ විස්තර	28 - 29
6 කොටස	අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර	30
7 කොටස	පරිපාලන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර	31
8 කොටස	අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර	31 - 32
9 කොටස	පර්යේෂණ ව්‍යාපෘති / පේටන්ට් බලපත්ර	
	සාරාංශය (පර්යේෂණ ව්‍යාපෘති / පේටන්ට් බලපත්ර)	33
	විස්තර (පර්යේෂණ ව්‍යාපෘති/ පේටන්ට් බලපත්ර)	34 - 35
10 කොටස	පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන	
	සාරාංශය (පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන)	35
	විස්තර (පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන)	36
11 කොටස	වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු	37
12 කොටස	ලැබී ඇති සම්මාන පිළිබඳ විස්තර	38
13 කොටස	2021 වසර තුළ ආරම්භ කළ නව පාඨමාලා පිළිබඳ විස්තර	38
14 කොටස	පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර	39
15 කොටස	ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර	39
16 කොටස	ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/ විදේශීය අරමුදල් සම්පාදිත)	40 - 41
17 කොටස	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)	42
18 කොටස	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම)	42
19 කොටස	මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය	42
20 කොටස	යටිතල පහසුකම් පිළිබඳ විස්තර	43
21 කොටස	මූල්‍ය ගිණුම් 2021	
	21.1 2021.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	44
	21.2 2021.12.31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	45
	21.3 2021.12.31 දිනෙන් අවසන් වසර සඳහා ශුද්ධ වත්කම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය	46
	21.4 2021.12.31 දිනෙන් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය	47
	21.5 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට සටහන්– 2021	48 - 61
	21.6 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට සටහන්	62 - 65
	21.7 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයට සටහන්	66 - 68
	21.8 ව්‍යවස්ථාපිත මණ්ඩලවල මූල්‍ය කාර්ය සාධනය 2021	69
	21.9 විගණන කමිටු වාර්තාව 2021	70 - 71
22 කොටස	තිරසාර සංවර්ධනය පිළිබඳ අනාගත වාර්තාව	72 - 74
23 කොටස	විගණකාධිපතිගේ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අදහස්	75 - 89

- උසස් ඉගෙනුමෙහි විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් ලෙස අන්තර්ජාතික පිළිගැනීම මුදුන් පමුණුවා ගැනීම

- ගෝලීය පිළිගැනීම සමග ජාතික සහ අන්තර්ජාතික අදාළකත්වය සහිතව පර්යේෂණ, නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය තුළ විශිෂ්ටත්වය මුදුන් පමුණුවා ගැනීම

- ජාතික අවශ්‍යතාවලට සහ කර්මාන්තයේ සහ සමාජයේ අපේක්ෂාවලට ප්‍රතිචාර වශයෙන් අධ්‍යාපනය සපයන ප්‍රමුඛ විශ්වවිද්‍යාලයක් බවට පත් වීම

- එහි ක්‍රියාකාරකම් තුළ විශිෂ්ටත්වය මුදුන් පමුණුවා ගැනීමට විශ්වවිද්‍යාලය තුළ බුද්ධිමය සහ භෞතික පරිසරය වැඩි දියුණු කිරීම

- දිදුලන විශ්වවිද්‍යාලයක තත්ත්වය ළඟා කර ගැනීමට මනාව උගත්, කුසලතා පූර්ණ සහ තෘප්තිමත් කාර්ය මණ්ඩල සහ ශිෂ්‍ය ප්‍රජාවක් බිහි කිරීම

- උසස් තාක්ෂණය සහ උපදේශන සේවා පිළිබඳ ප්‍රමුඛ විශේෂඥ සේවා සැපයුම්කරුවකු බවට පත් වීම

- ශ්‍රී ලංකාවේ සියලු අදාළ ශික්ෂණයන් සහ උසස්/වෘත්තීය අධ්‍යාපනය තුළ ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ ජාතික සංවර්ධනයේ දී රජයට උපදේශකයෙකු වීම

- තත්ත්ව පාලනය සහ කාර්යක්ෂම සංස්ථාපිත පාලනය විශ්වවිද්‍යාල සංස්කෘතිය තුළට ඇතුළත් කිරීම

නිල බලයෙන් සාමාජිකයන්:

උපකුලපති (සභාපති)	මහාචාර්ය එන්.ඩී ගුණවර්ධන
නියෝජ්‍ය උපකුලපති	මහාචාර්ය පී.කේ.එස් මහානාම
පීඨාධිපති, වාස්තු විද්‍යා පීඨය	ආචාර්ය ඩී.පී චන්ද්‍රසේකර
පීඨාධිපති, ව්‍යාපාර පීඨය	මහාචාර්ය එස්.ඩබ්ලිව්.එස්.බී දසනායක
පීඨාධිපති, ඉංජිනේරු පීඨය	මහාචාර්ය එන්.කේ වික්‍රමාරච්චි
පීඨාධිපති, තොරතුරු තාක්ෂණ පීඨය	බී.එච් සුදන්ත මහතා
පීඨාධිපති, උපාධි අධ්‍යයන පීඨය	මහාචාර්ය අජිත් ද අල්විස්
වෛද්‍ය පීඨය	මහාචාර්ය එෆ්.ආර් ප්‍රනාන්දු

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කළ සමාජිකයන්:

මහාචාර්ය ඊ.ආර්.කේ පෙරේරා මිය (2020.01.21 සිට)
සම්මානිත මහාචාර්ය, සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය, මොරටුව විශ්වවිද්‍යාලය

ආචාර්ය ප්‍රියන්ත බන්දු වික්‍රම (2020.01.21 සිට)
ලේකම්, නාගරික සංවර්ධන අමාත්‍යාංශය

වෛද්‍ය එක්.කේ.සී ගුණරත්න මිය (2020.01.21 සිට)
නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගොඩ රෝහල

වෛද්‍ය කේ.ඩී.පී විජේසිංහ (2020.01.21 සිට)
අධ්‍යක්ෂ, කාසල් වීදියේ කාන්තා රෝහල

වාස්තු විද්‍යාඥ ඇෂ්ලි ඩි වොස් (2020.01.21 සිට)
වරලත් වාස්තු විද්‍යාඥ

ප්‍රසන්න ලාල් ද අල්විස් මහතා (2020.01.21 සිට)
ජනාධිපති නීතිඥ

යූ.ඩී.සී ජයලාල් මහතා (2020.01.21 සිට)
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්, කළුතර

අනෝමා ඉද්දමල්ගොඩ මිය (2020.01.21 සිට)
මානව සම්පත් විශේෂඥ

ටිෂාන් සුබසිංහ මහතා (2020.01.21 සිට)
කළමනාකාර අධ්‍යක්ෂ, MOORE ස්ටෙෆන්ස් කන්සල්ටින්ග් (පුද්) සමාගම

ඩී ලක්සිරි මෙන්ඩිස් මහතා (2020.09.03 සිට)

එෂාන ද සිල්වා මහතා (2021.03.03 සිට)
සභාපති, ජාතික සංවර්ධන බැංකුව පී එල් සී

සනාතන සභාව විසින් පත් කළ සාමාජිකයන්: මහාචාර්ය බී.එම්.ඩබ්ලිව්.පී.කේ අමරසිංහ මිය

මහාචාර්ය ඒ.එස් කරුණානන්ද

ලේඛකාධිකාරි (ලේකම්): ඩ.එම්.ඩී.පී මඩවල හුළුගල්ල මිය

මූල්‍යාධිකාරි (ආරාධනය මත): කේ.ඒ.ඩී පුෂ්පකීර්ති මයා

මොරටුව විශ්වවිද්‍යාලය
සංවිධාන සටහන



1. විශ්වවිද්‍යාල ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය

1960 දී පිහිටුවන ලද කටුබැද්ද ප්‍රායෝගික තාක්ෂණ ආයතනයේ අනුප්‍රාප්තික වන මොරටුව විශ්වවිද්‍යාලය (UOM) 1966 දී පිහිටුවන ලද ලංකා තාක්ෂණ විද්‍යාලය, 1972 පෙබරවාරි 15වන දින කටුබැද්ද මණ්ඩපය ලෙස කටයුතු කිරීම ආරම්භ විය.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කටුබැද්ද මණ්ඩපය එහි වර්තමාන ආයතනික නාමය වන "ශ්‍රී ලංකා මොරටුව විශ්වවිද්‍යාලය" යන නම සහිතව ස්වාධීන විශ්වවිද්‍යාලයක තත්ත්වය ලබා ගත්තේය.

වර්තමානයේදී, මොරටුව විශ්වවිද්‍යාලය වාස්තුවිද්‍යා, ඉංජිනේරු, තොරතුරු තාක්ෂණ, උපාධි අධ්‍යයන, ව්‍යාපාර සහ වෛද්‍ය යන පීඨ හයකින් යුක්ත විය. වෛද්‍ය පීඨය 2020 ඔක්තෝබර් මාසයේදී ආරම්භ කරන ලදී. 2021 වසර අවසානයේදී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මගින් තෝරා ගත් සිසුන් සඳහා ප්‍රථම උපාධි පාඨමාලා දහතුනක් (13) පිරිනමන අධ්‍යයන අධ්‍යයනාංශ තිස් පහක් (35) විශ්වවිද්‍යාලය සතු විය. වර්තමානයේදී, UOM පිරිවැය අය කර ගැනීමේ පදනම මත පශ්චාත් උපාධි පාඨමාලා පනස් හතරකට (54) අධික සංඛ්‍යාවක් පවත්වා ගෙන යයි. ඉන් 2022 වසරේදී වැඩසටහන් 41ක් පවත්වා ඇති අතර නව පශ්චාත් උපාධි වැඩසටහන් කිහිපයක් ඇතුළුව වැඩසටහන් 22ක් සඳහා නව ඇතුළත් කර ගැනීම් සිදු කර ඇත.

1 වගුව- මොරටුව විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයනාංශ

වාස්තු විද්‍යා පීඨය	උපාධි අධ්‍යයන පීඨය
වාස්තු විද්‍යා අධ්‍යයනාංශය	තොරතුරු තාක්ෂණ පීඨය
නගර සහ ග්‍රාම සැලසුම් අධ්‍යයනාංශය	තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය
ගොඩනැගිලි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය	සංඛ්‍යාත්මක ගණිත අධ්‍යයනාංශය
සමෝධානික නිර්මාණ අධ්‍යයනාංශය	අන්තර් ශික්ෂණ අධ්‍යයන අධ්‍යයනාංශය
ව්‍යාපාර පීඨය	වෛද්‍ය පීඨය
තීරණ විද්‍යා අධ්‍යයනාංශය	මානව විද්‍යා අධ්‍යයනාංශය
කර්මාන්ත කළමනාකරණ අධ්‍යයනාංශය	ජෛව රසායන සහ සායනික රසායන විද්‍යා අධ්‍යයනාංශය
තාක්ෂණ කළමනාකරණ අධ්‍යයනාංශය	
ඉංජිනේරු පීඨය	කායික විද්‍යා අධ්‍යයනාංශය
රසායන විද්‍යා හා ක්‍රියාවලි ඉංජිනේරු අධ්‍යයනාංශය	ඖෂධ විද්‍යා අධ්‍යයනාංශය
සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය	ක්ෂුද්‍ර ජෛව විද්‍යා සහ පරපෝෂිතවේද අධ්‍යයනාංශය
පරිගණක විද්‍යා හා ඉංජිනේරු අධ්‍යයනාංශය	ප්‍රජා වෛද්‍ය සහ පවුල් වෛද්‍ය අධ්‍යයනාංශය
භූ සම්පත් ඉංජිනේරු අධ්‍යයනාංශය	
විදුලි ඉංජිනේරු අධ්‍යයනාංශය	පටකවේද සහ අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය
විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශය	වෛද්‍ය සහ මනෝ සෞඛ්‍ය අධ්‍යයනාංශය
භාෂා අධ්‍යයනාංශය	ශල්‍ය සහ නිර්විඳින්දන අධ්‍යයනාංශය
ද්‍රව්‍ය විද්‍යා හා ඉංජිනේරු අධ්‍යයනාංශය	ප්‍රසව සහ නාරීවේද අධ්‍යයනාංශය
යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය	ළමා රෝග හා නවජ රෝග අධ්‍යයනාංශය
ගණිත අධ්‍යයනාංශය	වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය
රෙදිපිළි සහ ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනාංශය	වෛද්‍ය තාක්ෂණ අධ්‍යයනාංශය
ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණ අධ්‍යයනාංශය	

මොරටුව විශ්වවිද්‍යාලය, අද වන විට ශ්‍රී ලංකාවේ හොඳම විශ්වවිද්‍යාලවලින් එකක් ලෙස කීර්තිය ලබා ගෙන ඇත. අධ්‍යාපනය සම්බන්ධව ගත් කල, කීර්තිමත් ලෝක පූජිත විශ්වවිද්‍යාලයක ඕනෑම පශ්චාත් උපාධි වැඩසටහනක් සඳහා පසුවෙන් ඇතුළත් විය හැකි සහ අධ්‍යයන හා පරිචය යන දෙකින්ම අන්තර්ජාතිකව කීර්තිමත් උසස් විශ්වවිද්‍යාලයකින් බිහිවූ උපාධිධාරීන් මෙන් දක්ෂ ලෙස කටයුතු කළ හැකි - තාක්ෂණ ක්ෂේත්‍රවල "ඉතා උසස් උපාධිධාරීන් බිහි කිරීමට" විශ්වවිද්‍යාලය මහත් වෙහෙසක් දරයි. ඒ අනුව මොරටුව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ඉලක්කය වන්නේ අධ්‍යාපනිකව ඉතා සාර්ථක, ආත්ම විශ්වාසයෙන් යුත්, නම්‍යශීලී, උපාධිය ලැබීමෙන් පසු ඉතා ඉක්මනින් රැකියාවක නිරත විය හැකි, ජාත්‍යන්තර වශයෙන් ගුණාත්මක තත්වයේ

සිටින උපාධිධාරීන් බිහි කිරීම සහ එමෙන්ම ඔවුන් උපාධි ලබන විට අපේ ශිෂ්‍යයන් හුදෙක් "රැකියා සොයන්නන්" නොව "රැකියා නිර්මාපකයන්" බවට පත්වීමට පුහුණු කිරීමයි.

විශ්වවිද්‍යාලය ක්‍රමෝපාය සැලසුම්කරණය සහ බොහෝ මූලාරම්භයන් ක්‍රියාවට නැංවීම මගින් ශ්‍රී ලංකාව "දැනුම් මධ්‍යස්ථානයක්" බවට පත් කිරීමට දායක වන අතරතුර අප රටේ ආර්ථික සංවර්ධනයේදී ක්‍රියාකාරී සහභාගිවන්නෙකු වීම පිණිස ඉලක්ක කීපයක් සකසා ඇත.

මෙම පසුබිම සමඟ, මෙම සමාලෝචනය පළමුව මොරටුව විශ්වවිද්‍යාලයෙහි උසස් අධ්‍යාපනය පිළිබඳ වූ ජයග්‍රහණ සහ පිළිගැනීම් දෙස බලයි. ඉන් අනතුරුව එය ක්‍රමෝපාය සැලසුම්කරණ අංශ, ප්‍රාග්ධන ආයෝජන, නවෝත්පාදනීය සහ ව්‍යවසායක උපාධිධාරීන් බිහි කිරීම, විශ්වවිද්‍යාල-කර්මාන්ත අන්තර්ක්‍රියා, තත්ත්ව ආරක්ෂණය සහ පර්යේෂණ පැතිකඩ සහ ජාත්‍යන්තරකරණය වැඩිදියුණු කිරීමේ අපේ ප්‍රයත්න දෙස බලයි.

1.1 විශ්වවිද්‍යාල අධ්‍යාපනයට ප්‍රවේශය ඉහළ යාම

වර්තමානයේදී, UOM හි ප්‍රධාන පරිශ්‍රයේ 8917ක උපාධි අපේක්ෂක ශිෂ්‍ය ගහනයක් සිටී. ඉංජිනේරු පීඨය උපාධි පාඨමාලා තුනක් පිරිනමයි. එනම් විද්‍යාවේදී ඉංජිනේරු උපාධිය (විශේෂවේදී ශික්ෂණ දහයකින්), ප්‍රවාහන හා කාර්ය සම්පාදන කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ මෝස්තර නිර්මාණය හා නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය.

වාස්තු විද්‍යා පීඨය උපාධි වැඩසටහන් හයක් පිරිනමයි, නම් වශයෙන් වාස්තු විද්‍යා පිළිබඳ විද්‍යාවේදී, සැලසුම්කරණය පිළිබඳ විද්‍යාවේදී සහ ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ විද්‍යාවේදී, පහසුකම් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී, නගර හා ග්‍රාම සැලසුම්කරණය පිළිබඳ විද්‍යාවේදී සහ භූ දර්ශන වාස්තු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය. තොරතුරු තාක්ෂණ පීඨය තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධි වැඩසටහන් තුනක් පිරිනමයි, තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ 2021 සිට කෘත්‍රිම බුද්ධිය පිළිබඳ විද්‍යාවේදී උපාධිය. ව්‍යාපාර පීඨය ව්‍යාපාර විශ්ලේෂණය, ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය සහ මූල්‍ය විශ්ලේෂණය යන විශේෂිත ක්ෂේත්‍ර තුන සමඟ ව්‍යාපාර විද්‍යාවේදී උපාධි වැඩසටහන පිරිනමයි.

වාස්තු විද්‍යා පීඨය, ව්‍යාපාර පීඨය, ඉංජිනේරු පීඨය සහ තොරතුරු තාක්ෂණ පීඨය මගින් පිරිනමනු ලබන සියලු උපාධි පාඨමාලා වසර 4ක ගෞරව උපාධි පාඨමාලා වන අතර MBBS උපාධි පාඨමාලාවේ කාල සීමාව වසර පහකි. මෙයට අමතරව, තොරතුරු තාක්ෂණ පීඨය මගින් හවුල්කාර ආයතනවල සහාය ද ඇතිව බාහිරව සපයන්නා වූ වැඩසටහනක් ලෙස තොරතුරු තාක්ෂණවේදී උපාධි වැඩසටහන (BIT) පිරිනමයි.



රූප සටහන 1 – පසුගිය වසර 10 තුළ සිසුන් බඳවා ගැනීම

මොරටුව විශ්වවිද්‍යාලය විවෘත හා දුරස්ථ අධ්‍යයන ක්‍රමයේ (ODL) සිය පළමු බාහිර උපාධි පාඨමාලාව වන තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධි පාඨමාලාව (BIT) 2006 වසරේ දී ආරම්භ කරන ලදී. මොරටුව විශ්වවිද්‍යාලය සඳහා වූ ප්‍රධාන සැලැස්ම මෙම විවෘත හා දුරස්ථ අධ්‍යයන ක්‍රමය උසස් පෙළ සුදුසුකම් ලත්, විශේෂයෙන්ම ගම්බද ප්‍රදේශවල සිසුන් විශාල සංඛ්‍යාවකට විශ්වවිද්‍යාලය මඟින් පිරිනමන උසස් ගුණාත්මක අධ්‍යාපනයට ප්‍රවේශ වීමට ඇති හැකියාව කැපී පෙනෙන ලෙස ඉහළ නංවන ක්‍රමයක් ලෙස හඳුනා ගනී. මෙම තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධි (BIT) වැඩසටහන ප්‍රධාන වශයෙන් පිළිගත් හවුල්කාර සංවිධාන හරහා ලබා දෙන අතර එය ගුණාත්වය සහතික කර ශිෂ්‍ය සංඛ්‍යා පාලනය කරන නිසා මෙම මොඩලය වෙනත් බොහෝ විශ්වවිද්‍යාල මගින් පිරිනමන බාහිර උපාධිවලට වඩා වෙනස් වේ. 2021 වසරේදී මෙම වැඩසටහන සඳහා බඳවා ගැනීම 524ක් වූ අතර වර්තමානයේදී මෙම වැඩසටහන හදාරන ලියාපදිංචි ශිෂ්‍යයන් සංඛ්‍යාව 1255කි.

1.2 ජයග්‍රහණ සහ සම්මානයට පාත්‍රවීම්

පසුගිය වසර දහයක කාලය තුළ සැලකිය යුතු ලෙස ඉහළ ගිය වාර්ෂික බඳවා ගැනීම් නොසලකා සහ සීමිත පහසුකම් සමගින් මොරටුව විශ්වවිද්‍යාලය එහි සියලු උපාධිධාරීන්ගේ අදාළතාව හා ගුණාත්මකභාවය අඛණ්ඩව පවත්වා ගැනීමට සහ වැඩිදියුණු කිරීමට සමත්වී ඇත. 2021 වසරේ සිදු කළ උපාධිධාරීන්ගේ සේවානියුක්ති රටාව පිළිබඳ නිරීක්ෂණ සමීක්ෂණයට අනුව මොරටුව විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් සම්බන්ධව කර්මාන්තය හා එහි සේවායෝජකයන් අතර විශාල ඉල්ලුමක් ඇති බව පෙන්නුම් කරමින්, උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවේ දී සියලු උපාධිධාරීන්ගෙන් 94.3%ක් ද ඉංජිනේරු උපාධිධාරීන්ගෙන් 91.4%ක් ද, ප්‍රමාණ සමීක්ෂණ උපාධිධාරීන්ගෙන් 91.9%ක් ද, ප්‍රවාහන සහ පහසුකම් කළමනාකරණ උපාධිධාරීන්ගෙන් 94.6%ක්ද තොරතුරු තාක්ෂණ උපාධිධාරීන්ගෙන් 96.6%ක් ද රැකියාවල නියුක්ත වූ බව වාර්තා වූයේ, කර්මාන්තය සහ සේවායෝජකයන් විසින් මොරටුව විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් බඳවා ගැනීම කෙරෙහි මහත් සැලකිල්ලක් දක්වන බව පෙන්වමිනි.



2 රූප සටහන - විවිධ උපාධි විෂයයන්වල රැකියා නියුක්තිකභාවය 2021

2021 වසරේ දී, අවසන් විභාගයට පෙනී සිටි 1550ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව අතුරින් සිසුන් 1441 (93%) දෙනෙක් සිය පළමු උපාධිය හිමි කර ගැනීම සඳහා පනවා ඇති අවම කාල පරිච්ඡේදය තුළ උපාධිය හිමි කර ගත්හ. 2021 වසරේ උපාධි ප්‍රදානෝත්සවයේ දී පිරිනමන ලද මුළු උපාධි සංඛ්‍යාව 1958ක් වූ අතර එයින් උපාධි 1465ක් ප්‍රථම උපාධි වූ අතර 493ක් පශ්චාත් උපාධි විය.

මොරටුව විශ්වවිද්‍යාලය එහි කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් සිය කාර්යසාධනය හරහා ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් ක්ෂේත්‍ර රාශියකින් ලබා ගෙන ඇති සම්මාන අනුව එහි විශිෂ්ට කාර්ය සාධනය ඉදිරියට ගෙන යන ලද අතර සමහර කැපී පෙනෙන ඒවා සමහරක් පහත දක්වා ඇත.

ජාත්‍යන්තර සම්මාන සහ සම්මානයට පාත්‍රවීම්:

- ENTC අධ්‍යයනාංශයේ මහාචාර්ය රොහාන් මුණසිංහ, නිරවද්‍ය කෘෂිකර්මය, අනුවර්තන රථවාහන පාලනය, ඩ්‍රෝන් යෙදුම් සහ අලි මිනිස් ගැටුම ඇතුළු ක්ෂේත්‍ර කිහිපයක පර්යේෂණ සඳහා නිව් යෝර්ක් කෝනෙල් විශ්ව විද්‍යාලයේ ෆුල්බ්‍රයිට් වෘත්තීය ශිෂ්‍යත්ව සම්මානයක් දිනාගෙන ඇත. ඔහු කෝනෙල් විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා ජීව විද්‍යා විද්‍යාලයේ බාහිර විශාරදයෙකු ලෙස පත් කර ඇති අතර ඔහු කෝනෙල් AgriTech අංශය, පක්ෂි විද්‍යාගාරය සහ ඉංජිනේරු පාසල හා කටයුතු කරයි. මහාචාර්ය මුණසිංහ මහතා විශ්වවිද්‍යාල කර්මාන්ත සහයෝගීතාව සහ තාක්ෂණ හුවමාරුව සඳහා කෝනෙල් වර්ධනය කර ඇති යහපත් පරිවයන් අධ්‍යයනය කරමින්, කෝනෙල් තාක්ෂණ බලපත්‍ර කාර්යාලය (CTL) සමඟ ද සම්බන්ධ වී කටයුතු කරයි.

- මොරටුව විශ්වවිද්‍යාලයේ ENTC හි ආචාර්ය ප්‍රතාපසිංහ ධර්මවංශ මහතාගේ අධීක්ෂණය යටතේ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශයේ (ENTC) උපාධි අපේක්ෂක සිසුන් (Team T-Cubed) කණ්ඩායමක් IEEE Signal Processing Cup (SP Cup) ප්‍රථම ස්ථානය, 2021 ජූනි 6 සිට 11 දක්වා ටොරොන්ටෝ හි අතථ්‍ය ලෙස පැවති ධ්වනි විද්‍යාව, කථනය සහ සංඥා සැකසුම් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICASSP) 2021 සමුළුවේ තරඟයෙහි දී දිනා ගත්හ.

- මොරටුව විශ්වවිද්‍යාලයේ ENTC හි ආචාර්ය චමීර එදුස්සූරියගේ අධීක්ෂණය යටතේ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ (ENTC) උපාධි අපේක්ෂකයින් දස දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් වන, DigitX කණ්ඩායම, 2021 අගෝස්තු 11 සිට 13 දක්වා කැනඩාවේ මොන්ට්‍රියල් හිදී අතථ්‍ය ලෙස පවත්වන ලද ස්වයංක්‍රීය පද්ධති පිළිබඳ අභ්‍යන්තර සම්මන්ත්‍රණය (ICAS) 2021 දී ශිෂ්‍ය අභියෝගයේ ශූරයන් බවට පත් විය.

- පිලිපීනයේ මැනිලා නුවර කළමබු ප්ලැන් මාණ්ඩලික විද්‍යාලයේ 12වන අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස 2021 සැප්තැම්බර් 1 සිට වසර 3ක කාලයක් සඳහා රෙදිපිළි සහ ඇඳුම් තාක්ෂණ අධ්‍යයනාංශයේ මහාචාර්ය ජී.එල්.ඩී. වික්‍රමසිංහ මහතා පත් කරන ලදී. ඔහු මෙම තනතුරට පත්වූ පළමු ශ්‍රී ලාංකිකයා වේ.

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - ආචාර්ය අයි.එන්. මානවඩු මහතාට 2021 අගෝස්තු මාසයේදී ඉන්දියාවේ වරලත් ගණකාධිකාරීගේ ආයතනය විසින් සංවිධානය කරන ලද ICAI ජාත්‍යන්තර පර්යේෂණ සම්මාන 2021 හි බදුකරණ කාණ්ඩයේ හොඳම පර්යේෂණ පත්‍රිකාව සඳහා රන් පලිහ ප්‍රදානය කරන ලදී.

- "Image Processing for the Detection of Papillary Thyroid Carcinoma using Nuclear Features" යන මාතෘකාවෙන් යුත් ලිපිය, තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිධාරියකු වන ආචාර්ය තුෂාරි සිල්වා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පරිගණක ගණිත අංශය, මොරටුව විශ්වවිද්‍යාලය), සහ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ව්‍යාධි විද්‍යා අංශයේ ආචාර්ය හර්ෂිමා වික්‍රමසිංහ සහ මහාචාර්ය චන්දු ද සිල්වා 2021 සැප්තැම්බර් මස පැවති SLMA 134වන සංවත්සර ජාත්‍යන්තර වෛද්‍ය සම්මේලනයේ දී පිළිකා පෝස්ටර ඉදිරිපත් කිරීමේ හොඳම පත්‍රිකාව සඳහා ඩැන්නි ආටිගල සම්මානය ලබා ගත්හ.

- වියට්නාමයේ හැනෝයි VinUniversity සත්කාරකත්වය දරන VinUniversity Global Case තරඟයේ (VGCC) හොඳම කණ්ඩායම් 20 අතරට මොරටුව විශ්වවිද්‍යාලය නියෝජනය කරමින්, යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශයෙහි සිසුන් කණ්ඩායමක් වන Falcon E කණ්ඩායම සමත් විය. රටවල් 30ක තරඟකරුවන් 500කට වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන් මෙම සම්මාන ප්‍රදානෝත්සවය 2021 දෙසැම්බර් 04 වන දින පැවැත්විණි.

- යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශයෙහි අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වන සසිරංග ද සිල්වා මහතා UNEP හි ගෝලීය විදුලි සංචලතා වැඩසටහනේ කොටසක් වන විද්‍යුත් ද්වි සහ ත්‍රිරෝද රථවල ගෝලීය තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායමට තාක්ෂණික කමිටු සාමාජිකයෙකු ලෙස පත් කර ඇත.

ජාතික සම්මාන සහ සම්මානයට පාත්‍රවීම්:

- විශ්වවිද්‍යාලය නියෝජනය කරන යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශයෙහි සිසුන් කණ්ඩායමක් වන Team Mora Avions IMechE UAS (මිනිසුන් රහිත ගුවන් පද්ධති) අභියෝගතා තරඟය (අථත්‍ය) 2021 සාර්ථකව නිම කර ඇති අතර, ලොව පුරා කණ්ඩායම් 15ක් සමග තරඟ වැද 2වන අනුශූරතාව ලබා ගත්තේය. හොඳම පාරිසරික තිරසාර නිර්මාණයට හිමි සම්මානය දිනා ගැනීමට ද ඔවුන් සමත්ව ඇත.

- Dell Technologies, Snowflake, සහ Amazon Web Services විසින් අනුග්‍රහය දක්වන ලද Axiata Digital Labs විසින් සත්කාරකත්වය දක්වන ලද AI Summit Hackathon 2021 සමාරම්භක AI Summit Hackathon 2021 හි පළමු අනුශූරතාව මොරටුව විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ පීඨයේ අවසන් වසරේ උපාධි අපේක්ෂකයින් කණ්ඩායමක් විසින් දිනා ගන්නා ලදී.

- 2021 මැයි 1වන දින පැවැත්වුණු ප්‍රවාහනය සහ භාණ්ඩ හා සේවා සැපයීම පිළිබඳ වරලත් ආයතනය - ශ්‍රී ලංකා (CILT) නෙක්ස්ට් ජෙනරේෂන් විසින් සංවිධානය කරන ලද ලිපි ලිවීමේ තරඟය Ink Your Thoughts 2021 - හි "Emission-Free Maritime Cargo Transportation" සහ "Expansions in Planning as a Solution for Container Terminals" යන ලිපි සඳහා ප්‍රවාහනය සහ භාණ්ඩ හා සේවා සැපයුම් කළමනාකරණ අධ්‍යයනාංශයෙහි උපාධි අපේක්ෂකයින් දෙදෙනෙකු පළමු අනුශූරතාව සහ දෙවන අනුශූරතාව ලෙස තේරී පත් විය.

- මොරටුව විශ්වවිද්‍යාලයේ IEEE PES ශිෂ්‍ය ශාඛාව විසින් සංවිධානය කරන ලද IEEE FOR THE COUNTRYSIDE ("GAMMEDDATA IEEE API") – 2 අදියර, DARREL CHONG STUDENT ACTIVITY AWARD 2021 හි රන් ජයග්‍රාහකයෙකු ලෙස තෝරාගෙන ඇත. DARREL CHONG STUDENT ACTIVITY AWARD 2020 රිදී කාණ්ඩයට 1 අදියර ඇතුළත් වූ බැවින් මෙය ශිෂ්‍ය ශාඛා පරිච්ඡේදය සඳහා කැපී පෙනෙන සන්ධිස්ථානයකි.

- මහාචාර්ය ඩබ්ලිව්.කේ. මාම්පෙආරච්චි මහතාගේ අධීක්ෂණය යටතේ අවසන් වසරේ තනි පුද්ගල පර්යේෂණ ව්‍යාපෘතියක් වන "Mix Design and Pavement Analysis of Thin Surfaced Asphalt Pavements for Low Volume Roads" 2021 ඔක්තෝබර් 09 දින පවත්වන ලද IESL තරුණ සාමාජිකයින්ගේ තාක්ෂණික සම්මන්ත්‍රණයේදී හොඳම පත්‍රිකාව සඳහා වන "ඉංජිනේරු වන්ද්‍රසේන සම්මානය – 2021" දිනා ගත්තේය.

- තොරතුරු තාක්ෂණ පීඨයේ අවසන් වසරේ ශිෂ්‍යයෙක් 2021 Toptal JavaScript Speed Coding Challenge 2021 හි ගෝලීය ශ්‍රේණිගත කිරීම්වල 33, ආසියා සහ පැසිෆික් ශ්‍රේණිගත කිරීම්වල 09 සහ ශ්‍රී ලංකා ශ්‍රේණිගත කිරීම් 01 ලබා ගෙන සහභාගිවන්නන්ගේ ඉහළම 01% අතරට ඇතුළත්ව ශ්‍රී ලංකාවට සහ මොරටුව විශ්වවිද්‍යාලයට ගෝලීය වේදිකාවක් මත කීර්තිය ගෙන දුන්නේය.

- ශ්‍රී ලංකා තරුණ විදුලි සහ විද්‍යුත් ඉංජිනේරු ආයතනය විසින් සංවිධානය කරන ලද UPSKILL Sri Lanka 2021 ලේඛන තරඟයේදී තොරතුරු තාක්ෂණ පීඨයේ ශිෂ්‍යයෙකුට 03වන ස්ථානය හිමි විය.

- ශ්‍රී ලංකා තාක්ෂණ මණ්ඩපයේ IEEE ශිෂ්‍ය ශාඛාවේ පරිගණක සංගමය විසින් සංවිධානය කරන ලද Hacktron V1.0 ගේම් සංවර්ධන ඇරඹුම් කඳවුරේදී තොරතුරු තාක්ෂණ පීඨයේ 19වන ශිෂ්‍ය

කාණ්ඩයේ උපාධි අපේක්ෂකයින්ගෙන් සමන්විත "Gladiators" කණ්ඩායමට හොඳම කණ්ඩායම් 10 අතරට පැමිණීමට හැකි විය. . ඔවුන් CodeGen International හි අනුබද්ධිත ආයතනයක් වන ශ්‍රී ලංකාවේ පිහිටි indie වීඩියෝ ගේම් සංවර්ධන චිත්‍රාගාරයක් වන RAM Studios විසින් ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලද කණ්ඩායම් දෙකෙන් එකකි. කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන ලද ගේම් ට්‍රේලර් වීඩියෝ සඳහා Facebook ප්‍රතිචාරය මත පදනම්ව ජයග්‍රාහකයින් තෝරා ගන්නා ලද "වඩාත්ම ජනප්‍රිය ගේම් ට්‍රේලර්" තරඟයේ 02වන අනුශූරතාව ද ග්ලැඩියේටර්ස් කණ්ඩායම විසින් දිනා ගන්නා ලදී.

- 2021 නොවැම්බර් 19වන දින 80 Club of Colombo හිදී පැවති ADCON 2021 අන්තර් විශ්වවිද්‍යාල වෙළඳ දැන්වීම් තරඟයේදී ශූරතාව මොරටුව විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පීඨයේ 2020 බඳවා ගැනීමේ උපාධි අපේක්ෂකයින් කණ්ඩායමක් විසින් දිනා ගන්නා ලදී.

- L. Arct. වාස්තු විද්‍යා අධ්‍යයනාංශයේ කථිකාචාර්ය (පරිවාස) ශාමීන් ධර්මසේන මහතාට 2021 දෙසැම්බර් 18 නුවර පැවති ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලයේ 10වන වාර්ෂික හරිත ගොඩනැගිලි සම්මාන උළෙල 2021 දී 'Outstanding Green Professional of the Year Award 2021 – Honorable Mention' පිරිනමන ලදී. හරිත ගොඩනැගිලි පරිචයන් සහ හරිත තාක්ෂණය යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රය පරිවර්තනය කිරීමෙහිලා ඔහුගේ කැපවීම සහ ආකර්ෂණීය ජයග්‍රහණ අගයමින් මෙය ප්‍රදානය කෙරේ.

- ආචාර්ය විරාජ් මුතුගල මහතාගේ ආචාර්ය උපාධිය සාමාන්‍ය වසර 04ක් තුළ අධීක්ෂණය කිරීම වෙනුවෙන් මහාචාර්ය බුද්ධික ජයසේකර මහතා ජාතික විද්‍යා පදනම (NSF) වෙතින් 2019 SUSRED සම්මානය ලබා ගත්තේය. මෙම සම්මාන උළෙල 2021 නොවැම්බර් 16වන දින BMICH හිදී ලෝක විද්‍යා දින වැඩසටහන සමඟ සමගාමීව පැවැත්විණි.

1.3 ප්‍රධාන සැලසුම සහ උපාය මාර්ගික කළමනාකරණ සැලසුම

2020 සහ 2030 වසර සඳහා වූ මොරටුව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සැලසුම වාස්තු විද්‍යා පීඨයේ කාර්ය මණ්ඩල කණ්ඩායමක් විසින් සංවර්ධනය කරන ලදී. විශ්වවිද්‍යාලයේ සියලු වර්තමාන භෞතික සංවර්ධන ක්‍රියාකාරකම් මෙම ප්‍රධාන සැලසුම අනුව සිදු කරනු ලැබේ. විශ්වවිද්‍යාලයේ කඩිනම් පුළුල් වීමත් සමඟ, 2020 සහ 2030 සඳහා සංශෝධිත ප්‍රධාන සැලසුමක් විශ්වවිද්‍යාලයේ සියලු පීඨ නියෝජනය කරන විශේෂඥයන් කණ්ඩායමක් විසින්, ජාතික සංවර්ධන සැලසුම් සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සංයුක්ත සැලසුම් සමඟ අනුකූලව මොරටුව විශ්වවිද්‍යාලයේ භෞතික යටිතල පහසුකම්වල කඩිනම් සංවර්ධනය ඇතුළත් කරමින් වැඩි දියුණු කරමින් පවතී.

උපායමාර්ගික කළමනාකරණ සැලසුම (SMP) 2017-2018 පෙර සංයුක්ත සැලැස්ම 2010-2015 සංශෝධනය කිරීමෙන් වැඩි දියුණු කරන ලද අතර 2013 වසරේ පසු භාගයේදී සියලු උනන්දුවක් දක්වන පාර්ශ්ව සමඟ බොහෝ සෙයින් සාකච්ඡා කිරීමෙන් පසුව 2014 මාර්තුවලදී විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කරන ලදී. උපායමාර්ගික කළමනාකරණ සැලසුම 2014-2018 හි සමාලෝචනය පෙන්නුම් කරන්නේ මොරටුව විශ්වවිද්‍යාලය සිය ඉලක්ක සහ අරමුණු ලඟා කරගෙන කර ඇති බව සහ ඒවා ඉටුකර ගැනීම සඳහා මූල්‍යමය බැඳීම් එතරම් වැදගත් නොවන අතර ඉතිරි කොටස සපුරා ගැනීම කෙරෙමින් පවතින බවය.

උපකුලපති, පාලක සභාවේ සාමාජිකයන්, සනාතන සභාවේ සාමාජිකයන් සහ විශ්වවිද්‍යාලයේ තෝරා ගත් අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය ඇතිව 2017-2021 සඳහා උපායමාර්ගික කළමනාකරණ සැලසුම යාවත්කාලීන කිරීමට දෙදින බුද්ධි කලම්බන වැඩමුළුවක් 2017 ජනවාරි මස පවත්වන ලද අතර තවත් වැඩමුළුවක් උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, ලේඛකාධිකාරී, පීඨාධිපතිවරුන් සහ වැඩ බලන පුස්තකාලයාධිපති සමඟ තෝරා ගත් අධ්‍යයන සහාය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙකුගේ සහභාගිත්වය ඇතිව පෙබරවාරි මස එක් දින වැඩමුළුවක් ලෙස පවත්වනු ලැබීය.

1.4 ප්‍රාග්ධන ආයෝජන

මොරටුව විශ්වවිද්‍යාලයට එහි භෞතික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සැලකිය යුතු අරමුදල් සැපයීමක් ලැබුණු අතර මොරටුව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් පුළුල් කිරීමට සමගාමීව පසුගිය වසර පහක කාලය තුළ සම්පූර්ණ කළ ඉදි කිරීම් සහ සිදු කෙරෙමින් පවතින ව්‍යාපෘති පිළිබඳ විස්තර 2 වගුවෙහි දැක්වේ.

2021 වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) හරහා භාණ්ඩාගාරයෙන් ලැබුණු අරමුදල්වලින් ප්‍රාග්ධන ආයෝජනය ඉදි කිරීම් සඳහා රු. මිලියන 279.9 ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සඳහා රු. මිලියන 63.0 සහ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා රුපියල් මිලියන 82.0 කි.

වගුව – පසුගිය වසර 5 තුළ ප්‍රාග්ධන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති.

ව්‍යාපෘතිය	වටිනාකම (රු. මිලියන)	තත්ත්වය
වාස්තුවිද්‍යා පීඨය – අදියර III (ඒකාබද්ධ සැලසුම)	110	2017 දී සම්පූර්ණ කරන ලදී
පරිපාලන ගොඩනැගිල්ල සඳහා දිගුව	282	2017 දී සම්පූර්ණ කරන ලදී
වාස්තු විද්‍යා පීඨය සඳහා දේශන කාමර ගොඩනැගිල්ල (වානේ)	164	2017 දී සම්පූර්ණ කරන ලදී
ඉංජිනේරු පීඨය සඳහා බහුකාර්ය ගොඩනැගිල්ල (වානේ)	184	2017 දී සම්පූර්ණ කරන ලදී
අධිවේගී මාර්ග පරීක්ෂණ විද්‍යාගාරය අදියර II	23.7	2018 දී සම්පූර්ණ කරන ලදී
රෙදිපිළි සහ ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනාංශය	307	2018 දී සම්පූර්ණ කරන ලදී
රෙදිපිළි සහ ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනාංශය සඳහා රෙදිපිළි දිගු ගොඩනැගිල්ලේ බිම් සහ මෙසනින් මහල්වල ඉතිරි වැඩ	28	2019 දී සම්පූර්ණ කරන ලදී
ගොඩනැගිලි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය සඳහා ගොඩනැගිල්ල	75	කෙරෙමින් පවතී
ද්‍රව්‍ය විද්‍යා සහ ඉංජිනේරු අධ්‍යයනාංශය	439	කෙරෙමින් පවතී
යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය සඳහා යෝජිත ගොඩනැගිල්ල	247	කෙරෙමින් පවතී
වාස්තු විද්‍යා පීඨයේ දේශන ශාලා ගොඩනැගිල්ලේ ශේෂ වැඩ (පෙර සැකසූ වානේ) සම්පූර්ණ කිරීම	150	කෙරෙමින් පවතී
ඉංජිනේරු පීඨයේ බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ (පෙර සැකසූ වානේ) සම්පූර්ණ කිරීම	200	කෙරෙමින් පවතී

1.5 නවෝත්පාදක සහ ව්‍යවසායකත්ව හැකියා සහිත උපාධිධාරීන් බිහි කිරීම

වසර තුනක් සඳහා ජාතික සංවර්ධන බැංකුවේ මූල්‍ය සහයෝගීතාව ඇතිව විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පළමු වරට ඇති කළ කර්මාන්ත සහාය ලද "ව්‍යවසායකත්වය පිළිබඳ එන්ඩීබී බැංකුවේ ගරු මහාචාර්යවරයා/සාමාජික" 2010 දී මොරටුව විශ්වවිද්‍යාලය විසින් පිහිටුවන ලදී. මේ යටතේ වූ පළමු ගරු මහාචාර්යවරයා 2010 වසරේ ඔක්තෝබර් මාසයේ දී පත් කරන ලද අතර මේ යටතේ ගන්නා ලද ව්‍යවසායක මූලාරම්භයන් ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ තරුණ ව්‍යවසායක (YESL) වැඩසටහන සමගින් විශ්වවිද්‍යාලයේ ව්‍යවසායකත්ව සංස්කෘතිය කැපී පෙනෙන ලෙස වැඩිදියුණු කරන ලද අතර ඉංජිනේරු උපාධි විෂය නිර්දේශයට ව්‍යවසායකත්වය පිළිබඳ සුළු විශේෂිකරණයක් හඳුනවා දෙන ලදී.

විශ්වවිද්‍යාලයෙහි තවත් වැදගත් මූලාරම්භයක් වූයේ කර්මාන්ත මූල්‍ය සේවා (IFS) වෙතින් අරමුදල් සහිතව වසර තුනක කාල පරිච්ඡේදයක් තුළ රු. මිලියන 16කට වඩා වැඩි ආයෝජනයක් සමගින් "නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය" පිළිබඳ සමාන සම්මානිත තනතුරක් පිහිටුවීමය. මෙම අරමුණ සඳහා 2014 නොවැම්බර් මාසයේදී ගිවිසුමක් අත්සන් කරන ලද අතර නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය පිළිබඳ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකුගේ පත් කිරීම ඇතිව 2015 සැප්තැම්බර් මාසයේදී නව ව්‍යවසායකත්ව මූලාරම්භය දියත් කරන ලදී.

නව සොයා ගැනීම්, නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය සඳහා පහසුකම් සැලසීමේ යාන්ත්‍රණ ඇති කිරීම සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් හා කාර්ය මණ්ඩලය අතර ව්‍යවසායකත්වය පිළිබඳ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ විශ්වවිද්‍යාලයේ උපායමාර්ග යටතේ 2017 වසර තුළ දී වැදගත් පියවර කීපයක්ම ගනු ලැබීය. ආරම්භක පොදු වැඩ අවකාශය පදනම් කර ගත් ශ්‍රී ලංකාවේ ප්‍රථම රාජ්‍ය විශ්වවිද්‍යාලය "The Enterprise" විවෘත කරන ලදී. The Enterprise දැනටමත් යෝජිත පෞද්ගලික අංශයේ හවුල්කාරිත්ව සමඟ තවදුරටත් එක් වීමට තව

පහසුකම් සමග වර්තමානයේ ආරම්භ කිරීම් 25කට ආසන්න සංඛ්‍යාවකට බිහි කිරීමට විශ්වවිද්‍යාලයට මං සලසා ඇත. නවෝත්පාදන, ව්‍යවසායකත්ව හා තාක්ෂණික බලපත්‍ර ලබා ගැනීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ මධ්‍යස්ථානය The Enterprise වනු ඇත. විශ්වවිද්‍යාල ආරම්භ කිරීම් සඳහා විවෘත කාර්යාල පරිසරයක් සපයන අතර, එය විශ්වවිද්‍යාලය තුළම තවදුරටත් සහයෝගිතාව වර්ධනය කිරීම සහ නවෝත්පාදනවලට පහසුකම් සැලසීම අරමුණු කර ඇත.

සම-වැඩ අවකාශයට ආරම්භයේදී සිසුන් 15කගේ ආරම්භ කිරීම්වලට සහ කර්මාන්ත ආරම්භ කිරීම් 3කට (උපාධිධාරීන් විසින් ආරම්භ කිරීම්) හැකියාව ඇත. සෑම තෝරා ගත් ශිෂ්‍ය ආරම්භ කිරීමක් සඳහාම අභ්‍යන්තර රැස්වීම් ශාලාවට සහ ආහාර ගබඩා කාමරයට පිවිසීම සමග නොමිලේ Wi-Fi සහිත ඉන්කියුබේටර්හි ආසන 2 සිට 3 දක්වා සංඛ්‍යාවක් ලබා ගැනීමට අවස්ථාව ලබා දෙනු ඇත. තවද, කර්මාන්ත ආරම්භ කිරීම් 3කට වටිනම් කළ මිලට පිරිනමනු ලබන ආසන 5 සිට 6 දක්වා සංඛ්‍යාවක් ලබා ගත හැකි වනු ඇත. සම-වැඩ අවකාශය තේරීමේ නිර්ණායකය වඩාත්ම කැපී පෙනෙන ආරම්භ කිරීම් තෝරා ගැනීම විශේෂයෙන් සහතික කිරීමට සකසා ඇත. වර්තමානයේ, මොරටුව විශ්වවිද්‍යාලය ආරම්භක ජීවන චක්‍රයේ විවිධ අවස්ථාවල ආරම්භ කිරීම් 80ක් ගොඩ නංවා ඇත. 2017 පෙබරවාරි ආරම්භ කරන ලද Mora Ventures මොරටුව විශ්වවිද්‍යාලයේ කෙරෙමින් පවතින ආරම්භක ඉන්කියුබේටරය වේ. වසර 2027 වන විට ශ්‍රී ලංකාවේ ප්‍රථම යුනිකෝන් (ඇමෙරිකානු ඩොලර් බිලියනය ඉක්මවන ආරම්භ කිරීම) ආරම්භ කිරීම තෙක් Mora Ventures ත්‍රෛමාසිකව සිදු කිරීමට බලාපොරොත්තු වේ.

Enterprise, University Business Linkage Cell 2020 දී එහි ආරම්භක කණ්ඩායම් සඳහා ක්‍රියාකාරකම් මාලාවක් දියත් කර ඇත. "AGX, Pristine, ThermalR, Wiyamana, AbRuTeCh, සහ MagicBit" ආරම්භක කණ්ඩායම් මෙම ක්‍රියාකාරකම් සඳහා සහභාගී විය. ක්‍රියාකාරකම් මාලාවට සමාගම් සංස්ථාගත කිරීම සහ කළමනාකරණය, මූල්‍ය හැසිරවීම, සැලසුම් චින්තනය, නිෂ්පාදන ඇසුරුම්කරණය සහ අලෙවිකරණය පිළිබඳ සැසි ඇතුළත් විය.

ජීව වායු දහන පද්ධතියක් සඳහා විමෝචන පාලනය යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීමේ අරමුණින් නව පර්යේෂණ මුලපිරීමක් 2020 අප්‍රේල් 21 දින පිහිටුවන ලදී. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය මොරටුව විශ්වවිද්‍යාලයේ රසායනික සහ පිරිසැකසුම් ඉංජිනේරු අධ්‍යයනාංශයේ සහ ජර්මනියේ ටෙක්නිෂ් හොච්ෂුලේ නර්න්බර්ග් ජෝර්ජ් සිමොන් ඕම් හි මහාචාර්ය ක්‍රිස්ටෝෆ් බෙයර්ගේ ඒකාබද්ධ අධීක්ෂණය යටතේ සිදු කරනු ඇති අතර එය විවිධ දහන පාලන තන්ත්‍ර යටතේ ජීව වායු දහනය විශ්ලේෂණය කිරීම සඳහා පරිගණක තරල ගතික වේදිකා මිශ්‍රණ සහ දහන ප්‍රතික්‍රියා සංඛ්‍යාමය වශයෙන් අනුකරණයට කිරීමේ අරමුණින් යුතු වේ.

දැනට විශ්වවිද්‍යාලයට ඇති පේටන්ට් බලපත්‍ර අයදුම්පත් 33 පේටන්ට් ප්‍රදාන සඳහා NIPO විසින් සකසනු ලබන අතර 2020 දී යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශයේ මහාචාර්ය R.A.R.C. ගෝපුර විසින් “Under-Actuated and Self-Adaptive Mechanism for a Robotic Finger” සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබා ගන්නා ලදි.

ව්‍යවසායකත්ව පරිසරයක් නිර්මාණය කිරීම සඳහා වූ විශ්වවිද්‍යාල ව්‍යායාමයන්හි දී මෙම මූලාරම්භයන් මඟින් දැනටමත් පිහිටුවා ඇති බුද්ධිමය දේපළ උපදේශන කමිටුව (IPAC), විශ්වවිද්‍යාල කර්මාන්ත සම්බන්ධීකරණ ඒකකය (UIIC) සහ අධ්‍යයනාංශ හා පීඨවල පිහිටි ඉන්කියුබේටර් වැනි ආයතන ඌණපූරණය කරනු ඇත. ඒවා අපගේ උපාධිධාරීන් “රැකියා සොයන්නන් වෙනුවට රැකියා නිර්මාපකයන්” බවට පත් කිරීම සඳහා සහ ඉදිරි වාණිජකරණය සඳහා මහ පාදන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ නව සොයා ගැනීම් වෙනුවෙන් පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සඳහා කැපී පෙනෙන දායකත්වයක් දක්වනු ඇත.

1.6 විශ්වවිද්‍යාල කර්මාන්ත අන්තර්ක්‍රියාකාරිත්වය

ඵලදායක විශ්වවිද්‍යාල කර්මාන්ත අන්තර්ක්‍රියාකාරිත්වය මොරටුව විශ්වවිද්‍යාලයේ ප්‍රබලතම ගුණාංගවලින් එකකි. පොදු මූලාරම්භයන්ට අර්ධ කාලීන පශ්චාත් උපාධි වැඩසටහන්, කෙටිකාලීන වැඩසටහන්, පුහුණු හා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) පාඨමාලා, සමුළු, වැඩමුළු, උපදේශක මණ්ඩල හා පරීක්ෂණ පැවරුම්, කර්මාන්තයේ අරමුදල් ආධාර ලද පර්යේෂණ හා සංවර්ධන විද්‍යාගාර, සම්මානිත ධුර, අධ්‍යයනාංශ කර්මාන්ත උපදේශක මණ්ඩල, පීඨ කර්මාන්ත උපදේශක මණ්ඩල, සහ සංස්ථා සමාජ වගකීම් ක්‍රියාකාරකම් ඇතුළත් වේ. කර්මාන්තවලට සහ ඒ අනුව රටේ ආර්ථික සංවර්ධනයට සහාය වීමට අමතරව කාර්ය මණ්ඩල සාමාජිකයන්ට, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහ ඒ හා සමාන ආයතනවලට ප්‍රතිලාභ ගෙන එන නිසා විශ්වවිද්‍යාලය මෙම කර්මාන්ත සහ සමාජය සමග අන්තර්ක්‍රියා දැඩිව දිරිමත් කරයි.

කර්මාන්ත මගින් අරමුදල් සැපයූ පර්යේෂණ මධ්‍යස්ථාන සාර්ථක විශ්වවිද්‍යාල කර්මාන්ත සහයෝගීතාව සඳහා තවත් වැදගත් යාන්ත්‍රණයකි. මෙයට දශකයකට පෙර ස්ථාපනය කළ ජංගම සන්නිවේදනය සඳහා වූ ඩයලොග් UOM පර්යේෂණ විද්‍යාගාරය, විදුලි සංදේශ ක්ෂේත්‍රය තුළ කර්මාන්ත පාදක පර්යේෂණ හා නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ ඉතා සාර්ථක ආදර්ශයක් බවට පත් වී ඇත. මෙම විද්‍යාගාරයේ සාර්ථකත්වය ඉලෙක්ට්‍රොනික ආශ්‍රිත නව තාක්ෂණ සඳහා වූ "Zone 24X7 UOM පර්යේෂණ විද්‍යාගාරය", රබර් හා සම් නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය සඳහා වූ "SIL-UOM විද්‍යාගාරය", ජෛව වෛද්‍ය තාක්ෂණය සඳහා වූ "ප්‍රිමියම් ඉන්ටර්නැෂනල්- UOM", ලිපිද්‍රව්‍ය තාක්ෂණය සඳහා වූ සිලෝන් පෙන්සිල් කොපරේෂන් ATLUS-UOM, සහ ද්‍රව්‍ය පර්යේෂණය සඳහා INSEE – UOM, ශිෂ්‍ය කර්මාන්ත පත් කිරීම සහ විදේශ පුහුණුව ඇතුළුව පුහුණුව, පර්යේෂණ, සැලසුම් සහ තාක්ෂණික හැකියා ශක්තිමත් කිරීම, වාර්ෂික විලාසිතා ප්‍රදර්ශනය සඳහා නිෂ්පාදන සංවර්ධනය සහ සහාය සඳහා Textured Jersey ආයතනය, "Epic-UOM Innovation Lab" නම් වූ අංගසම්පූර්ණ නවීනතම පර්යේෂණ හා නවෝත්පාදන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ පළමු කෘත්‍රිම බුද්ධි නවෝත්පාදන විද්‍යාගාරය ලෙස ලංකා විදුලිබල සමාගම සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ "QBITS" සමඟ එක්ව විදුලි ඉංජිනේරු අධ්‍යයනාංශයේ මයික්‍රෝ ග්‍රිඩ් නියමු ව්‍යාපෘතියක් සහ ස්මාර්ට් ග්‍රිඩ් පර්යේෂණාගාරයක් පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීමට හේතු විය. තවද, SLIoT නිර්මාණ නවෝත්පාදන විද්‍යාගාරය සිසුන්ගේ Internet of Things (IoT) (IoT) පදනම් කර ගත් විසඳුම් සංවර්ධනය සඳහා මූලාකෘති සහ ක්ෂේත්‍ර යන දෙඅංශයෙන්ම, මොරටුමුල්ල දැව ආශ්‍රිත කර්මාන්තය නඟා සිටුවීම සඳහා දැව නිර්මාණ නවෝත්පාදන මධ්‍යස්ථානයක් පිහිටුන ලද්දේ ව්‍යාපාර පීඨය (TDIC) LAKARCADE (පුද්) සමාගම සමඟ, BPM උපාධි අපේක්ෂකයින්ට ව්‍යාපාර ක්‍රියාවලි විශ්ලේෂණය සහ වැඩිදියුණු කිරීම් යන ක්ෂේත්‍රවල වාසිදායක නියැලීම් ලබා දීමට හවුල් වන අතරතුරය.

2020 වර්ෂය තුළ, මොරටුව විශ්වවිද්‍යාලයේ Uni-Consultancy Services (UNIC) සහ DSI සමාගම් සමූහය අතර වසර 9ක දීර්ඝ නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධන පර්යේෂණ හවුල්කාරිත්වය 2020 ජූලි 27 වන දින අලුත් කරන ලදී. මෙම අලුත් කිරීම හරහා ඩී. සැම්සන් ඉන්ඩස්ට්‍රීස් (පුද්.) සමාගමද කාර්මික සහයෝගීතාවයට සම්බන්ධ විය. තවද ලංකා විදුලි සමාගම (LECO) මොරටුව විශ්වවිද්‍යාලය (UOM) සමඟ එක්ව Microgrid හි පුරෝගාමී නියමු ව්‍යාපෘතියක් ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ප්‍රදාන ආධාර ඩොලර් මිලියන 1.8ක් සමඟින් දියත් කරන ලදි.

2021 දී Huawei Sri Lanka විසින් Huawei ICT Academy නවෝත්පාදන විද්‍යාගාරයක් මොරටුව විශ්වවිද්‍යාලය සමඟ එක්ව විවෘත කරන ලදී. මෙය දිවයිනේ විශාලතම Huawei ICT ඇකඩමිය සහ නවෝත්පාදන විද්‍යාගාරය ලෙස සැලකෙන අතර එය "Cultivating a Talent Ecosystem for Digitally Inclusive Sri Lanka" යන තේමාවෙන් යුතුය. Huawei ICT Academy Innovation Lab හි පරමාර්ථය වන්නේ ඉහළ මට්ටමේ Huawei සහතික ලබා ගැනීමට පරිසරය භාවිත කරමින් සැබෑ Huawei උපකරණයක් තුළ පුද්ගලයන් පුහුණු කිරීම, නවීන තාක්ෂණය සහ වේදිකා ලබා දීමෙන් විශ්වවිද්‍යාල පර්යේෂණ වැඩසටහන්වලට සහාය වීම සහ කර්මාන්ත සහ විශ්වවිද්‍යාල සහයෝගීතා ව්‍යාපෘති සහ පර්යේෂණ පැවැත්වීමෙන් නවෝත්පාදනයන් දිරිගැන්වීමයි.

එපමණක් නොව, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ මානව සම්පත් විසඳුම් සපයන්නා වන hSenid Business Solutions, 2021 ජූලි 05 වන දින එහි ව්‍යාපාර විද්‍යාවේදී උපාධි වැඩසටහනේ කොටසක් ලෙස මානව සම්පත් තොරතුරු පද්ධති බෙදා හැරීමේ දී මොරටුව විශ්වවිද්‍යාලය සමඟ හවුල් විය. මෙම හවුල්කාරිත්වය වැඩසටහනේ විෂය පථය තවදුරටත් පුළුල් කරයි, HRIS හි සාරය ග්‍රහණය කර ගනිමින් මානව සම්පත් අධ්‍යයනයට උපායමාර්ගික වටිනාකමක් එක් කරන අතර විශ්ලේෂණ සහ කෘත්‍රිම බුද්ධිය මත පදනම් වූ HR තාක්ෂණ ප්‍රගතිය සමඟ HR හි සම්පූර්ණ ස්වයංක්‍රීයකරණය පිරිනමයි.

සියලු කාර්ය මණ්ඩල සාමාජිකයන් විශ්වවිද්‍යාල කර්මාන්ත අන්තර්ක්‍රියාකාරී කටයුතුවල නියැලෙන අතරම රජයේ ඒකාබද්ධ අරමුදලින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා ලබා දෙනු ලබන ප්‍රදාන සඳහා ඔවුන් අධ්‍යයන අංශයෙන් වග වන බව තහවුරු කිරීමට ඔවුන් විසින් උපාධි අධ්‍යයන කටයුතු සම්බන්ධව සිය නිර්දේශිත අධ්‍යයන වැඩ පිළිවෙත් සහ අධ්‍යයන කටයුතු සම්පූර්ණ කරන බවට සහතික කර ගැනීම විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ ප්‍රතිපත්තිය වේ. උපාධිධාරීන්ගේ උසස් පුහුණුවීම් හා සුදුසුකම් ඉහළ නැංවීම සඳහා පිරිනමන පාඨමාලා; දැනුම හා තාක්ෂණ සංවර්ධනය කර මාරු කිරීමට පවත්වනු ලබන පුහුණු වැඩසටහන්, CPD පාඨමාලා, පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති, සම්මන්ත්‍රණ, වැඩමුළු හා අනෙකුත් අධ්‍යයන පැවරුම්; කර්මාන්තය සඳහා උපදේශනය හා පරීක්ෂණ පැවරුම්; සහ සංස්ථාපිත සමාජ වගකීම් ක්‍රියාකාරකම් වැනි කර්මාන්තයට සහ සමාජයට විශ්වවිද්‍යාලය මගින් ලබා දෙන අනෙක් සියලු සේවා අංක 380 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව පිරිවැය ප්‍රතිසාධනය කර ගැනීමේ (ස්ව-අරමුදල්කරණ) පදනම මත දියත් කරනු ලබන වැඩසටහන් වේ. ඒ අනුව මොරටුව විශ්වවිද්‍යාලය සමාජය හා කර්මාන්තය වෙනුවෙන් ඇති සිය බැඳියාව රජයට කිසිදු පිරිවැයක් නොමැතිව ඉටු කරයි.

1.7 තත්ත්ව ආරක්ෂණය

මොරටුව විශ්වවිද්‍යාලයේ **තත්ත්ව ආරක්ෂණය** එහි සේවාවල සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය පිළිබඳව ශිෂ්‍යයන්ට, කාර්ය මණ්ඩලයට, සේවාදායකයන්ට හා සමස්තයක් ලෙස මුළු ප්‍රජාවටම තහවුරු කිරීම සඳහා ඉගැන්වීමේ යෙදවුම්, අධ්‍යාපන ප්‍රතිඵල, පර්යේෂණ වේදිකා, කාර්යසාධන ඇගයීම්, පරිපාලන පද්ධතියෙන් සමන්විත ශිෂ්‍ය සේවා සහ විෂය බාහිර ක්‍රියාකාරකම්වලින් සමන්විත එහි ප්‍රධාන ක්‍රියාවලිවල ප්‍රමිති, විධිමත්, සංගත සහ පාරදෘශ්‍ය ආකාරයකින් කාර්යක්ෂමව හා විශ්වාසදායක ලෙස ළඟා කර ගන්නා වූ විශ්වවිද්‍යාල කළමනාකරණය තුළට කාවද්දන ලද ක්‍රියාවලියක් වේ. විශ්වවිද්‍යාලයේ QA ප්‍රතිපත්තිය මගින් ආයතනය තුළ අධ්‍යයන, අනධ්‍යයන සහ පරිපාලන යන සියලු කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ එමෙන්ම ශිෂ්‍යයන් විසින් ද පිළිගන්නා QA පදනම් වූ සංස්කෘතියක් සංවර්ධනය කොට කාවැද්දීමට අදහස් කරනු ලැබේ.

තත්ත්ව ආරක්ෂණ ක්‍රමෝපාය (QAS) විශ්වවිද්‍යාල SMP හි දක්වා ඇති දැක්ම සහ මෙහෙවර සමග සමගාමීය. SMP ක්‍රියාත්මක කිරීමේ දී, විශ්වවිද්‍යාල කළමනාකරණය කල්පනාකාරීව පිහිටුවන ලද ඉඹී ලකුණු සපුරා ගැනීමට එහි සේවාවල සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය පද්ධති, ක්‍රියාවලි සහ නිරීක්ෂණය කිරීමේ යාන්ත්‍රණ ස්ථාපිත කරයි. එබැවින් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකයේ (IQAU) නායකත්වය යටතේ ඒ එක එකක් ප්‍රමුඛතා කාර්යවලට වෙන් කරන SMP හි නිශ්චිතව දක්වා ඇති ඉලක්ක, ගුණාත්මක අරමුණුවලට සංක්ෂිප්ත කළ තත්ත්ව ප්‍රතිපත්තිවලට පරිවර්තනය කර ඇත. එක් එක් කාර්යයන් වැඩිදියුණු කිරීම සඳහා වගකීම දරන නිලධාරියා/පාර්ශ්වකරු හඳුනා ගෙන ඇති අතර තත්ත්ව ආරක්ෂණ සහ සහතිකකරණ කවුන්සිලයේ (QAAC) මාර්ගෝපදේශවලට අනුකූලව නියම කළ කාල පරිච්ඡේදවලදී බාහිර සහ අභ්‍යන්තර සමාලෝචන ආකාරයෙන් අඛණ්ඩව නිරීක්ෂණය කර ඇත. විශ්වවිද්‍යාල සනාතන සභාව සහ පාලක සභාව සිය මාසික රැස්වීම්වලදී IQAU හි ක්‍රියාකාරකම් සමාලෝචනය කරයි. අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය 2017 නොවැම්බර් මස නව පරිපාලන ගොඩනැගිල්ලේ විශ්වවිද්‍යාල උපකුලපතිතුමා විසින් විවෘත කර ප්‍රකාශයට පත් කරන ලදී.

මොරටුව විශ්වවිද්‍යාලය සිය මූලික උනන්දුවක් දක්වන පාර්ශ්වවලට, කාර්ය මණ්ඩලයට හා ශිෂ්‍යයන්ට සඵලදායක අත්දැකීමක් ලබා දීමට කටයුතු කරන අතර QAS එයින් අදහස් වන දේ පිරිනමයි. ජාත්‍යන්තර පරිමාණයේ විශිෂ්ට විශ්වවිද්‍යාලයකින් ලබා ගත හැකි උත්කෘෂ්ට ඉගෙනුම හා අධ්‍යාපනය කුමක්දැයි යන්න පිළිබඳ පැහැදිලි සිතුවමක් ද එමඟින් ලබා දෙයි. තත්ත්ව ආරක්ෂණ ක්‍රමෝපාය (QAS) පශ්චාත් උපාධි සහ පර්යේෂණ ඇතුළුව ඉගෙනුම් යෙදවුම් හා අධ්‍යාපන ප්‍රතිඵල සිදු වන බාහිර හා අභ්‍යන්තර සන්දර්භය දෙස බලන අතර එමගින් ප්‍රමිති වැඩිදියුණු කිරීම සහ පවත්වා ගැනීම සඳහා වූ පීඨ මට්ටමේ නව යාන්ත්‍රණ ද විස්තර කරයි. තනි අධ්‍යානාංශ සහ අංශ දක්වා දිවෙන එහි ජාල සමග මේ සම්බන්ධව පීඨ මට්ටමේ QA කුටි IQAU සමගින් ක්‍රියා කරයි.

එමෙන්ම, විවිධ පසුබිම්වලින් පැමිණෙන කාර්ය මණ්ඩලයට හා ශිෂ්‍යයන්ට ලද හැකි ඉඩප්‍රස්තාවලින් ප්‍රයෝජන ලැබීමටත්, අධ්‍යාපනික වශයෙන් හා පෞද්ගලිකව දියුණු වීමටත්, ගෝලීය අභියෝගතා සමගින් වෘත්තියකට ඇතුළු වීමේ දැනුම සහ කුසලතා සංවර්ධනය කර ගැනීමට සහ පිටත වැඩ ලෝකයේ සාර්ථකත්වයට දායක වීමට සහ පශ්චාත් උපාධි සුදුසුකම් සහ පර්යේෂණ හරහා වෘත්තියක් සොයාගෙන යාමට හැකි වන්නේ නම්, ඔවුන්ට අවශ්‍ය වන්නේ කුමක් ද යන්න පිළිබඳව ද තත්ත්ව සහතික ක්‍රමෝපාය (QAS) අවධානය යොමු කරයි. ඉගැන්වීම්වල ගුණාත්මකභාවය, පර්යේෂණ, උපදේශනය සහ ඒ කෙරෙහි ආයතනය තබන අගය මෙහි කොටසක් වන අතර මොරටු ව විශ්වවිද්‍යාලයේ කටයුතු මේ සම්බන්ධව ඇති වෘත්තීය විශිෂ්ටත්වයට සමගාමීව පවතින බව තහවුරු කිරීම සැලසුම් කිරීම පිණිස වූ කටයුතු තත්ත්ව ආරක්ෂණ ක්‍රමෝපායට (QAS) ඇතුළත් වේ.

තවද, ඉගැන්වීම් ප්‍රතිඵල, කාර්ය සාධන ඇගයීම්, පර්යේෂණ, ශිෂ්‍යත්ව සහ ව්‍යාපාර යනාදිය එකිනෙකට ඌනපූරක වන බව සහ ඒවායේ අන්තර්සම්බන්ධතාව සම්බන්ධව අද්විතීය දැක්මක් පිහිටුවීමට ආධාර කරන බව තත්ත්ව ආරක්ෂණ ක්‍රමෝපාය (QAS) සලකයි. ගෝලීය අභියෝග හමුවේ දිනෙන් දින තරහකාරී වන පරිසරයක් තුළ, තනි පුද්ගලයන්ට හා සමාජයට අවශ්‍ය වන දෑ සැපයීමට වර්ධනය වන පීඩනය හමුවේ සහ ආයතනය එහි තරහකරුවන්ගෙන් වෙන් කර හඳුනා ගැනීම සඳහා අංශවල විවිධතා විදහා දැක්වීමේ මොරටුව විශ්වවිද්‍යාලයේ මෙහෙවර නැවත තහවුරු කර ගැනීමට තත්ත්ව ආරක්ෂණ ක්‍රමෝපාය (QAS) උපකාරී වේ. ඇගයීමේ ගුණත්වය සහ සියලු අධ්‍යයන ප්‍රලේඛනය ඉහළ නැංවීමේ අදහසින් ලේඛන වෙෂ්යයට අදාළව මොරටුව විශ්වවිද්‍යාලය මෙම සන්දර්භය තුළ අදාළ ප්‍රතිපත්ති කිහිපයක් සංවර්ධනය කර ඇත. විශ්වවිද්‍යාලය සෑම විටම පෝෂණය කළ අගයන් පහත හෙළීමකින් තොරව වෙනස්කම් සමඟ වඩා හොඳින් කටයුතු කිරීමේ හැකියාව එමඟින් විශ්වවිද්‍යාල වෙත සැපයිය යුතුය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් මොරටුව විශ්වවිද්‍යාලයේ ආයතනික සමාලෝචනයේ (IR) තුන්වන චක්‍රය 2019 දී සිදු කරන ලදී. පෙර චක්‍ර දෙක 2006 සහ 2013 වර්ෂවලදී සාර්ථකව සිදු කරන ලදී.

මෙම වසරේ ආයතනික සමාලෝචනය සඳහා "A" ශ්‍රේණිය (හැකි ඉහළම ශ්‍රේණිය) ලබා ගැනීමට විශ්වවිද්‍යාලයට හැකි විය.

සමාලෝචන ක්‍රියාවලිය ආරම්භ වූයේ 2019 මැයි මාසයේදී ස්වයං ඇගයීම් වාර්තාව (SER) ඉදිරිපත් කිරීමෙනි. 2019 පෙබරවාරි මාසයේදී උපකුලපතිවරයාගේ නායකත්වය යටතේ මෙහෙයුම් කමිටුවක් DVC, අධ්‍යක්ෂ/තත්ත්ව ආරක්ෂණ, පීඨාධිපතිවරුන්, ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී, පුස්තකාලයාධිපති, ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පරිපාලන නිලධාරීන්ගෙන් සමන්විතව (සීමා නොවී) පිහිටුවන ලදී. මෙහෙයුම් කමිටුවට අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ විශ්වවිද්‍යාලයේ සිසුන්ගේ සහාය ලැබුණි.

SER ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, UGC විසින් දේශීය රාජ්‍ය විශ්වවිද්‍යාල පහක ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් පස් දෙනෙකුගෙන් සහ ජාත්‍යන්තරව පිළිගත් QA විශේෂඥයෙකු වන ජාත්‍යන්තර සමාලෝචකයෙකුගෙන් සමන්විත IR මණ්ඩලයක් පත් කරන ලදී. මොරටුව විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද SER පිළිබඳ ඩෙස්ක් ඇගයීමෙන් පසුව, මණ්ඩලය 2019 දෙසැම්බර් 16 සිට 21 දක්වා විශ්වවිද්‍යාලයට සිය අඩවි සංචාරය සිදු කළේය. සමාලෝචන මණ්ඩලය විසින් ඔවුන්ගේ සමාලෝචන වාර්තාව විශ්ව විද්‍යාලයට "A" ශ්‍රේණියක් ලබා දෙමින් ඔවුන්ගේ ප්‍රශංසා හා නිර්දේශ සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර පසුව එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල උපකුලපතිවරයා වෙත යොමු කරන ලදී. සමස්ත IR ක්‍රියාවලිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය (IQAU) විසින් අධ්‍යක්ෂ තත්ත්ව සහතිකකරණ යටතේ DR/අධ්‍යයන හා ප්‍රකාශන සහ AR/විදේශ කටයුතු සහ ප්‍රචාරණ වෙතින් කාර්ය සම්පාදන සහාය ඇතිව සම්බන්ධීකරණය කරන ලදී.

ලොව ප්‍රමුඛ විශ්වවිද්‍යාලයක් වීමේ අපගේ දැක්ම උදෙසා, මොරටුව විශ්වවිද්‍යාලය ලෝක ශ්‍රේණිගත කිරීමෙන් ඉහළ යාමට උත්සාහ දරමින් සිටින අතර 2021 දී මොරටුව විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ තෙවන හොඳම විශ්වවිද්‍යාලය සහ ලෝක විශ්වවිද්‍යාලවල වෙබෝමෙට්‍රික්ස් ශ්‍රේණිගත කිරීම්වලදී 2021 දෙසැම්බර් ලෝකයේ 2393වන ස්ථානයට (ඉහළම 20%) පත් විය. වෙබෝමෙට්‍රික්ස් ඇගයීමේ නිර්ණායකවල ස්වභාවය හේතුවෙන් මොරටුව විශ්වවිද්‍යාලය වැනි මධ්‍යම ප්‍රමාණයේ විශ්වවිද්‍යාලයකට තම ස්ථානය වැඩිදියුණු කිරීමට දුෂ්කරය.

ප්‍රථම වරට ආසියානු කලාපයේ විශ්වවිද්‍යාල 12,000 ක් පමණ අතරින් QS ආසියා විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම 2022 (QS AUR 2021) සඳහා සලකා බලන ලද විශ්ව විද්‍යාල 650 අතරින් 401- 450 ස්ථානයේ මොරටුව විශ්වවිද්‍යාලය ශ්‍රේණිගත කර ඇති අතර මෙයින් මොරටුව විශ්වවිද්‍යාලය ආසියාවේ ඉහළම පෙළේ විශ්වවිද්‍යාල 2.5%න් එකක් වේ.
මෙය CILT, IMechE, CText, IChemE, RIBA, RICS, CICES, PAQS වෙතින් ප්‍රථම උපාධි වැඩසටහන් කීපයක් සඳහා ජාත්‍යන්තර සහතිකකරණය පවත්වා ගැනීමට අමතරවය. ඉංජිනේරු අධ්‍යයන සුදුසුකම් සහතික කිරීමේ ආයතනය වන ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) සමඟින් 2014 ජූනිවලදී වොෂින්ටන් සම්මුතියෙහි පූර්ණ සාමාජිකයෙකු බවට පත්වෙමින්, දැන් මොරටුව විශ්වවිද්‍යාලයෙන් පිරිනමන සියලු ඉංජිනේරු උපාධි පාඨමාලා ගුණාත්මක වශයෙන් ලොව හොඳම විශ්වවිද්‍යාලවලින් පිරිනමන එම උපාධි පාඨමාලාවලට සමාන බව සැලකේ.

2020 වර්ෂය තුළදී, ප්‍රධාන වශයෙන් දැනටමත් ලබා ගත් ප්‍රතීතන අලුත් කිරීමට හා අවස්ථා කිහිපයකදී නව ප්‍රතීතනය සඳහා නිල සංචාර කිහිපයක් විය. ජාත්‍යන්තර පහසුකම් කළමනාකරණ සංගමයේ (IFMA) ප්‍රතීතන මණ්ඩලය මොරටුව විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයට ගොස් ගොඩනැගිලි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය මඟින් ඉදිරි වසර හය (06) සඳහා 2015 ඇතුළත් කර ගැනීමෙහි සිට පවත්වනු ලබන පහසුකම් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) වැඩසටහන ප්‍රතීතනය කරන ලදී. 2021 තුළ ඉංජිනේරු පීඨය මඟින් පිරිනමන විද්‍යාවේදී ඉංජිනේරු උපාධි වැඩසටහන් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් (IESL) නැවත ප්‍රතීතනය/ප්‍රතීතනය කරන ලදී.

2 මෙහෙවර - පහත දේ තුළින් දකුණු ආසියාවේ නාක්ෂණික සහ අදාළ ශික්ෂණවල ප්‍රමුඛ දැනුම් ව්‍යවසාය වීම:

• ගෝලීය අභියෝගවලට මුහුණ දීම සඳහා විමසුම් මනය පෝෂණය කරන සහ දැනුම් සහ කුසලතා සංවර්ධනය කරන නාක්ෂණික සහ ආශ්‍රිත ශික්ෂණවල ප්‍රතිසංස්කරණාත්මක අධ්‍යාපනය සැපයීමෙන්;

• දැනුම් පිළිබඳ සීමා මායිම් ව්‍යාප්ත කිරීමට සහ ජාතික නාක්ෂණික හැකියා ඉහළ නැංවීමට ජාතිකව වැදගත් සහ ඉහළ බලපෑම් සහිත පර්යේෂණ කරගෙන යාමෙන්;

• අන්තර්ජාතිකව ස්ථානගත වූ ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාලයක් ලෙස රජයට, කර්මාන්තයට සහ සමාජයට විශේෂඥ සේවා සැපයීමෙන්; සහ

• ශ්‍රී ලංකාවේ තිරසාර, විද්‍යාත්මක, නාක්ෂණික, සමාජයීය සහ ආර්ථික සංවර්ධනයට දායක වීම.

3 ප්‍රධාන ක්‍රියාකාරකම් - ඉංජිනේරු විද්‍යාව, වාස්තු විද්‍යාව, තොරතුරු තාක්ෂණය පිළිබඳ ඉගැන්වීම්, පර්යේෂණ, උපදේශන සහ වෙනත් වෘත්තීය ක්‍රියාකාරකම්.

4 කාර්යසාධන නැඹුරුව

No	විස්තරය	ඒකකය	2017	2018	2019	2020	2021
	ආදායම් සහ වියදම්						
1	රජයේ ප්‍රදාන - පුනරාවර්තන	Rs'000	1,950,496	2,329,350	2,756,920	2,875,000	3,185,000
2	ස්ව ආදායම්- පුනරාවර්තන	Rs'000	54,786	71,872	79,366	72,817	94,832
3	වෙනත් පුනරාවර්තන වියදම් (මහපොළ සහ ශිෂ්‍යාධාර ආදිය)	Rs'000	91,077	105,523	77,175	44,038	35,449
4	මුළු ආදායම්- පුනරාවර්තන (1+2+3)	Rs'000	**2,096,359**	**2,506,745**	**2,913,461**	**2,991,855**	**3,315,281**
5	මුළු සේවා නියුක්ති පිරිවැය	Rs'000	1,581,907	1,998,628	2,745,835	2,555,406	2,681,528
6	වෙනත් පුනරාවර්තන වියදම් (ක්ෂය හැර)	Rs'000	670,014	687,696	704,396	478,607	424,787
7	අතිරික්තය / හිඟය (4-(5+6))	Rs'000	**(155,562)**	**(179,579)**	**(536,770)**	**(42,158)**	208,966
8	රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන	Rs'000	745,000	562,000	400,000	423,000	374,850
9	වෙනත් ප්‍රදාන – ප්‍රාග්ධන වියදම්	Rs'000	668,647	8,224	78,571	114,174	76,207
10	උත්පාදිත අරමුදල – ප්‍රාග්ධන වියදම්	Rs'000	8,901	4,729	7,803	5,230	2,986
11	ප්‍රාග්ධන වියදම් - රජයේ ප්‍රදාන	Rs'000	780,993	545,575	423,514	387,341	453,857
12	පිරියැය ප්‍රතිසාධන ක්‍රියාකාරකම්වලින් ලැබීම්	Rs'000	590,905	600,635	623,107	556,765	793,218
13	පිරිවැය ප්‍රතිසාධන ක්‍රියාකාරකම් මත වියදම්	Rs'000	508,563	536,645	520,324	525,271	557,803
	වත්කම් සහ වගකීම්						
14	ආයෝජන	Rs'000	481,461	699,089	894,407	938,401	966,890
15	ජංගම නොවන වත්කම්	Rs'000	10,935,243	10,618,846	10,175,452	10,005,372	9,913,110
16	ජංගම වත්කම්	Rs'000	292,326	305,856	289,466	628,777	1,312,297
17	ජංගම වගකීම්	Rs'000	776,908	934,590	1,074,171	1,022,525	1,167,844
18	ජංගම නොවන වගකීම්	Rs'000	891,762	1,137,577	1,607,800	1,793,818	1,967,502
19	පරිත්‍යාග/විදේශ ආධාර (සමුච්චිත)	Rs'000	712,239	638,353	627,362	640,354	-
20	සමුච්චිත අරමුදල	Rs'000	9,328,120	8,913,271	8,049,993	8,115,854	9,056,949
21	සේවක සංඛ්‍යාව -අධ්‍යයන	(No's)	439	456	431	389	461
22	මුළු සේවක සංඛ්‍යාව	(No's)	1,099	1,193	1,150	1,045	1,171
23	ශිෂ්‍ය සංඛ්‍යාව	(No's)	7,902	7,912	8,369	6,798	7,503
	ප්‍රමුඛ කාර්ය සාධන දර්ශක						
i	මුළු ආදායමට ස්ව ආදායම්	%	2.61	2.87	2.72	2.43	2.86
ii	සේවකයකුට මුළු සේවා නියුක්ති පිරිවැය	Rs'000	1,439	1,675	2,388	2,445	2,290
iii	ශිෂ්‍යයෙකුට මුළු සේවා නියුක්ති පිරිවැය	Rs'000	200	253	328	376	357
iv	ශිෂ්‍යයකුට/වර්ෂයකට පුනරාවර්තන ප්‍රදාන	Rs'000	247	294	329	423	424
v	උපාධි අපේක්ෂයකුට මුළු පිරිවැය	Rs'000	859	967	1,088	1,294	1,471
vi	ඇතුළත	%	93	91	92	71	69
vii	සේවකයකුට ශිෂ්‍යයන්	(No's)	07:01	07:01	07:01	07:01	06:01
viii	අධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයකුට ශිෂ්‍යයන් (සතය)	(No's)	18:01	17:01	19:01	17:01	16:01
ix	වාහනයකට ශිෂ්‍යයන්	(No's)	202:01	202:01	209:01	178:01	197:01

21.9 විගණන කමිටු වාර්තාව -2021

විගණන කමිටුවේ සංයුතිය

විශ්වවිද්‍යාලයේ විගණන කමිටුව විධායක නොවන මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර මූල්‍ය කළමනාකරණ කුසලතාවලින් හෙබි පුද්ගලයකු මුලසුන හොබවයි.
2021 වසර සඳහා විගණන කමිටුවේ සංයුතිය.

එස්.එම්.ටී.එච් සුබසිංහ මයා	-	සභාපති
මහාචාර්ය ඊ.ආර්.කේ පෙරේරා මිය	-	සාමාජික
ඒ ඉද්දමල්ගොඩ මිය	-	සාමාජික

ඉහත සාමාජිකයන්ට අමතරව, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයන්ට සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණකවරයාට නිරීක්ෂකයන් ලෙස සහභාගී වීමට ඇරයුම් කරන ලදී.

ලේඛකාධිකාරී සහ මූල්‍යාධිකාරී ඇරයුම මත රැස්වීම්වලට සහභාගී වන අතර විශ්වවිද්‍යාලයේ අනෙක් කාර්ය මණ්ඩල සාමාජිකයන් කමිටුවට ඔවුන්ගේ පෙනී සිටීම අවශ්‍ය වන විට ඇරයුම් කරනු ලැබේ. කමිටුවේ ලේකම් ලෙස නියෝජ්‍ය අභ්‍යන්තර විගණක ක්‍රියා කරයි.

රැස්වීම්

පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/31ට අනුව, කමිටුව අවම වශයෙන් වසරකට හතර වතාවක් රැස්වීම අවශ්‍යයි. සමාලෝචනයට භාජනය වන වසර තුළ, කමිටුව අවස්ථා හතරකදී මුණ ගැසී ඇති අතර මෙම රැස්වීම්වලදී අභ්‍යන්තර සහ බාහිර විගණකවරයාගේ වාර්තා සහ විමසුම් පිළිබඳව සාකච්ඡා කරන ලදී. රැස්වීම්වල කාර්ය සටහන් තොරතුරු සහ අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා විශ්වවිද්‍යාලයේ පාලක සභාවට ලබා ගැනීමට හැකි බවට පත් කරන ලදී.

කමිටුවේ විෂය පථය

විගණන කමිටුවේ ප්‍රධාන අරමුණ වන්නේ විශ්වවිද්‍යාලයේ මූල්‍ය සහ අදාළ කටයුතු සම්බන්ධයෙන් පාලක සභාවේ වගකීම් කාර්යක්ෂමව කර ගෙන යාමට එයට සහාය දැක්වීමයි. යහපාලන චක්‍රලේඛය අනුව කමිටුවේ විෂය පථයට ඇතුළත් වන්නේ–

i. අභ්‍යන්තර විගණනයේ වගකීම් තීරණය කිරීම සහ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය කිරීම
ii. ආයතනයේ සියලු ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම සහ ඇගයීම
iii. ක්‍රමවත් කාලාන්තරවලදී පිරිවැය කාර්යක්ෂමතාව සඳහා සහ අපතේ යන වියදම් ආදිය නැති කිරීමට කාර්ය සාධනය සමාලෝචනය කිරීම.
iv. බාහිර විගණකවරුන් සමග සම්බන්ධීකරණය කිරීම සහ විගණකාධිපතිගේ විමසුම් සහ වාර්තා පසුවිපරම් කිරීම
v. ව්‍යවස්ථා, නියාමන රීති සහ චක්‍රලේඛවලට අනුකූලද යන්න තක්සේරු කිරීම.
vi. ගිණුම්කරණ ප්‍රමිත සමග අනුකූලතාව සහතික කිරීමට මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම
vii. පොදු ව්‍යාපාර (COPE) කමිටුවේ නිර්දේශ/නියම ක්‍රියාවට නැංවීම සමාලෝචනය කිරීම
viii. වාර්ෂික වාර්තාවේ ඇතුළත් කිරීමට කමිටුවේ සොයා ගැනීම්වල වාර්තාවක් පිළියෙළ කිරීම

වර්ෂය තුළ ක්‍රියාකාරකම්

සමාලෝචනයට භාජනය වන වසර තුළ පහත ක්‍රියාකාරකම් කමිටුව විසින් කර ගෙන යන ලදී.

1) **2021 වසර සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහන සහ ක්‍රියාකාරී සැලසුම නිර්දේශ කිරීම සහ අධීක්ෂණය කිරීම**

කමිටුව 2021 වසර සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහන සහ ක්‍රියාකාරී සැලසුම නිර්දේශ කළ අතර වර්ෂය පුරාම එහි තත්ත්වය අධීක්ෂණය කළේය. කමිටුව අභ්‍යන්තර විගණනයේ කාර්යක්ෂමතාව සහ අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය සාධනය සමාලෝචනය සහ අධීක්ෂණය කළේය.

2) **නීති සහ රෙගුලාසි සමග අනුකූලතාව සහතික කිරීම**

විගණන කමිටුව අදාළ නීති සහ රෙගුලාසි සමග අනුකූලතාවේ තත්ත්වය පිළිබඳ බාහිර විගණකවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන් විසින් ඉදිරිපත් කළ වාර්තා සමාලෝචනය කළේය.

3) **අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කිරීම සහ ශක්තිමත් කිරීම**

ස්ථාවර වත්කම්, ප්‍රාග්ධනය සහ පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල අභ්‍යන්තර පාලනයන්හි සඵලතාවය කමිටුව විසින් සමාලෝචනය කරන ලද අතර අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරන ලදී. කමිටුව විගණකාධිපති වර්තාවේ පෙන්වා දුන් දුර්වලතා සහ සමාලෝචනයට භාජනය වන වසර තුළ නිකුත් කළ විමසුම් නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග අඛණ්ඩව සමාලෝචනයද කළේය.

තවද, කමිටුව විසින් 2021 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය විසින් ලබා දෙන ලද සියලු නිර්දේශ සමාලෝචනය කරන ලද අතර 2022 ජූනි 08 වන දින පැවති COPE රැස්වීමේදී පෙන්වා දෙන ලද කරුණු සම්බන්ධයෙන් විශ්ව විද්‍යාලය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව පරීක්ෂා කිරීමේදී ක්‍රියාත්මක නොකළ සියලු ක්‍රියාමාර්ගවල ප්‍රගතිය ඇගයීමට ලක් කරන ලදී.

4) **බැදුම්කර කඩ කිරීමේ සිද්ධි සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම**

ජාතික විගණන කාර්යාලය විසින් වාර්තා කරන ලද බැදුම්කර කඩ කිරීම් ගැටලු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව කමිටුව විසින් බැදුම්කර විමර්ශන කමිටුව වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

5) **යහපාලනය සඳහා නව ක්‍රියාමාර්ග යෝජනා කිරීම**

විශ්වවිද්‍යාල කටයුතු සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු නව යෝජනා සහ නිවැරදි ක්‍රියාමාර්ග ලෙස ගත යුතු පියවර කමිටුව විසින් නැවත නිර්දේශ කරන ලදී.

සභාපති
විගණන කමිටුව
මොරටුව විශ්වවිද්‍යාලය
2022.11.04

(ඉංග්‍රීසි පිටපතේ අත්සන යොදා ඇත.)

22. තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව

තිරසර අරමුණු ළඟා කර ගැනීම

1. අරමුණු හා ඉලක්ක හඳුනාගැනීම

විශ්වවිද්‍යාලය විසින් නියම කරගත් සීමාවන් ඔස්සේ තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා කටයුතු කෙරෙමින් පවතී.

2020 සහ 2030 යන වසර සඳහා වූ මොරටුව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සැලසුම වාස්තු විද්‍යා පීඨයේ කාර්ය මණ්ඩල කණ්ඩායමක් විසින් සකස් කරන ලදී. විශ්වවිද්‍යාලයේ සියලු වර්තමාන භෞතික සංවර්ධන ක්‍රියාකිරකම් මෙම ප්‍රධාන සැලසුම අනුව සිදුකරනු ලැබේ. විශ්වවිද්‍යාලයේ කඩිනම් පුළුල් වීමත් සමඟ 2020 එහ 2030 සඳහා සංශෝධිත සැලසුමක් විශ්වවිද්‍යාලයේ සියලු පීඨ නියෝජනය කරන විශේෂඥයන් කණ්ඩායමක් විසින් ජාතික සංවර්ධන සැලසුම් සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සංයුක්ත සැලසුම් සමඟ අනුකූලව මොරටුව විශ්වවිද්‍යාලයේ භෞතික යටිතල පහසුකම්වල කඩිනම් සංවර්ධනය ඇතුලත් කරමින් වැඩි දියුණු කරමින් පවතී.

- අරමුණු අංක 04

පරිපූර්ණ සහ සමානාත්මතාවයෙන් යුත් ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට දිගුකාලීන අධ්‍යාපනික අවස්ථා ප්‍රවර්ධනය කිරීම

විශ්වවිද්‍යාලයේ උපාය මාර්ගික කලමනාකරණ සැලසුම තුල පරිපූර්ණ සහ සමානාත්මතාවයෙන් යුත් ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට දිගුකාලීන අධ්‍යාපනික අවස්ථා ප්‍රවර්ධනය කිරීම යන කරුණු පිළිබඳ ව පැහැදිලිව දක්වා ඇති අතර, විශ්වවිද්‍යාලයේ මගින් පවත්වනු ලබන සියළු ම අධ්‍යයන සහ පර්යේෂණ මූලික ක්‍රියාකාරකම් කටයුතු තුල මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමුඛත්වය ලබා දී කටයුතු කෙරේ.

ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම සඳහා ආචාර්යවරුන් බඳවා ගැනීමේදී ජාත්‍යන්තර මට්ටමේ නම් දරා ඇති විශ්වවිද්‍යාල වලින් ආචාර්ය උපාධි ලබාගත් ආචාර්යවරුන් සඳහා ප්‍රමුඛත්වය දීමට අපේක්ෂා කෙරේ.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ඉලක්කගත කර ඇත.

- අරමුණු අංක 05

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇති කිරීම සහ සියළු ම කාන්තාවන් සහ ගැහැණු දරුවන් සවිබල ගැන්වීම.

විශ්වවිද්‍යාලයේ උපාය මාර්ගික කලමනාකරණ සැලසුම තුල මේ පිළිබඳ ව පැහැදිලිව දක්වා ඇති අතර ඒ අනුව කටයුතු කෙරේ.

- අරමුණු අංක 06

සියළු දෙනාට ජල සහ සනීපාරක්ෂක්ෂක පහසුකම් සැපයීම සහතික කිරීම සහ ඒවායෙහි තිරසාර කළමණාකරණය.
100% ක් ඩෙංගු වැනි වසංගත රෝගවලින් තොර හරිත විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

- අරමුණු අංක 07

සියළු දෙනාට දැරිය හැකි මිලකට, විශ්වාසනීය, තිරසාර සහ නවීන බලශක්ති ප්‍රවේශ සහතික කිරීම.
බලශක්ති භාවිතය පිළිබඳ කළමණාකරණ කමිටුවක් පත්කර ඇති අතර 2030 වන විට 25% ක් කාර්යක්ෂම විකල්ප බලශක්ති සඳහා යොමු වීමට අපේක්ෂා කරන අතර මේවන විටත් Smart Grid ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

- අරමුණු අංක 09

ප්‍රශස්ථ යටිතල පහසුකම් ගොඩනැංවීම, පුළුල් හා තිරසාර කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම සහ නව්‍යකරණය.
මේ පිළිබඳ කර්මාන්ත ආශ්‍රිත පාර්ශවකරුවන් සමඟ ඒකාබද්ධ පර්යේෂණ පවත්වාගෙන යනු ලබන අතර ඒවා තවදුරටත් වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ.

- අරමුණු අංක 13

දේශගුණ විපර්යාස සහ එහි බලපෑම වලක්වා ගැනීමට කටයුතු කිරීම සහ ඒ පිලිබඳව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම

විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ඇතැම් අධ්‍යයන පාඨමාලා තුල ඉගැන්වීම් කටයුතු, පර්යේෂණ හා සංවර්ධන කටයුතු සහ උපදේශන කටයුතු ඔස්සේ ඉහත දක්වා ඇති අරමුණු අංක 06, 07, 09, සහ 13 ට අදාළ කරුණු පිළිබඳව අවධානය යොමු කොට තිබේ.

2. අරමුණු හා ඉලක්ක ආයතනයේ සැලසුම් වලට ඇතුලත් කිරීම

විශ්වවිද්‍යාල ව්‍යවස්ථා විධිවිධාන හා ප්‍රතිපත්ති වලට අනුකූල ව දැනුම බෙදා හැරීම තුලින් සවිබල ගැන්වීම (විශේෂයෙන් ම දුෂ්කර පලාත් වලින් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබූ ආර්ථික වශයෙන් පසුබෑමක් සහිත සිසු සිසුවියන් ගේ දිළිඳුකම තුරන් කිරීම) අරමුණු කර ගනිමින් අධ්‍යයන පාඨමාලා මෙහෙයවනු ලැබේ.

තවද, විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් මනා සැලසුම් සහගතව ප්‍රජා සංවර්ධන සහ සමාජ සත්කාරක වැඩසටහන් වල දිගින් දිගටම නියුතු ව සිටින අතර, මෙයින් බොහොමයක් සෘජුව ම අඩු ආදායම් ලාභී පුද්ගලයන්ට අධ්‍යාපනය ලබා දීම, භෞතික යටිතලපහසුකම් වැඩිදියුණු කිරීම ආදිය මගින් ඔවුන් තුළ පූර්ණ සංවර්ධනයක් ඇති කිරීම අරමුණු කරගනිමින් සිදු කරනු ලබයි.

3. දර්ශක සකස් කිරීම

අය-වැය ඇස්තමේන්තු තුල විශේෂයෙන් තිරසර සංවර්ධන අරමුණු සඳහන් කොට නැතත්, එම අරමුණු (විශේෂයෙන් ම අරමුණු අංක 04) සාක්ෂාත් කර ගැනීමේ ජාතික ප්‍රයත්නයට දායක වීම අරමුණු කර ගනිමින් අධ්‍යයන, පර්යේෂණ හා සංවර්ධන කටයුතු පැවැත්වීම සඳහා වක්‍රාකාරව ප්‍රතිපාදන ලබා ගැනීමට විශ්වවිද්‍යාලය අපේක්ෂා කරයි. එසේම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු තුලින් තිරසර සංවර්ධන අරමුණු අංක 5, 6, 7, 9, සහ 13 සාක්ෂාත් කර ගැනීමට ද කටයුතු කෙරේ. තවද, සියළු දෙනා හට පරිපූර්ණ සහ සමානාත්මතාවයෙන් යුත් ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ දිගුකාලීන අධ්‍යාපනික අවස්ථා ප්‍රවර්ධනය කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය සියළුම තත්ත්ව පාලන කටයුතු සිදු කිරීම සඳහා ද විශ්වවිද්‍යාලය විසින් අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කොට ඇත.

තවද, විශ්වවිද්‍යාලයට දුර බැහැර වෙසෙන විවිධ හැකියාවන් සහිත අරමුණු කර ගනිමින් විවෘත හා දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රය (CODL) මගින් පාඨමාලා මෙහෙයවනු ලැබේ. ඒ සඳහා අය-වැය ප්‍රතිපාදන වෙන් කොට ඇති අතර, විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය ක්‍රියාපටිපාටියෙන් බැහැර වෙමින් විවිධ හැකියාවන් සහිත පුද්ගලයන් හට අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන් වීමට මඟ විවර කිරීම මගින් ඔවුන් සවිබල ගන්වා ඇත. එවැනි කටයුතු වලට පහසුකම් සැපයීම සඳහා විශ්වවිද්‍යාලය විසින් අමතර අයවැය ප්‍රතිපාදන අපේක්ෂා කෙරේ.

4. දත්ත පවත්වා ගැනීම

අදාල පාඨමාලාව මෙහෙයවනු ලබන අධ්‍යයනාංශය මගින් ඒ ඒ පාඨමාලාවට අදාල දත්ත වාර්තා පවත්වා ගෙනු යනු ලැබේ.

5. සන්ධිස්ථාන හඳුනා ගැනීම

ක්‍රියාකාරී සැලසුම් සහ උපාය මාර්ගික සැලසුම් සංශෝධනය කිරීමෙන් අනතුරුව අධීක්ෂණය කල යුතු සන්ධිස්ථාන මොනවාදැයි අර්ථ දක්වනු ලැබේ. මෙය සංවර්ධන අදියරේ පවතින අතර, අදාළ ක්ෂේත්‍ර හඳුනාගෙන සුදුසු ක්‍රියාකාරී සැලසුම් සංවර්ධනය කෙරේ.

6. ප්‍රගතිය මැනීම

එක් එක් අධ්‍යයනාංශ මගින් පවත්වනු ලබන උපදේශන කමිටු රැස්වීම් මගින් සහ තත්ත්ව සහතික කිරීමේ ඒකකය මගින් ප්‍රගති සමාලෝචන කටයුතු සිදුකෙරේ.

23. විගණකාධිපතිගේ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අදහස්

ජාතික විගණන කාර්යාලය

தேசிய கணக்காய்வு அலுவலகம்

NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/C/UOM/6/21/FA

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 ජූලි 12 දින

උපකුලපති,

මොරටුව විශ්වවිද්‍යාලය.

මොරටුව විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් : 01. ලේකම්, මුදල් අමාත්‍යාංශය

02. ලේකම් ,අධ්‍යාපන අමාත්‍යාංශය

03. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்ல, இலங்கை. No. 306/72, Polduwa

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/C/UOM/6/21/FA

මෙම අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 ජූලි 12 දින

උපකුලපති
මොරටුව විශ්වවිද්‍යාලය

මොරටුව විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මොරටුව විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ao@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබිම් හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතකාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගත්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනියාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 760	නඩත්තු අංශයේ පිරිවැය රු.793,088 ක් වූ භාණ්ඩ අස්ථානගතවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු නොකර අවසන් තොගයෙන් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි.
(ii) මුදල් රෙගුලාසි 571 (2)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් කළ දින සිට වර්ෂ 02 ඉක්මවූ එකතු වටිනාකම රු.10,249,876 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතනත්ව සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය	විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයට පටහැනිව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී රු.1,874,019,805 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.
(ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛය	2021 දෙසැම්බර් 31 දිනට රු.13,245,551,250 ක් වූ ස්ථාවර වත්කම්වලට අදාළව පිළියෙල කළ ස්ථාවර වත්කම් ලේඛනයක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර හාවිතා කර නොමැති බව.

2.3 වෙනත් නිරීක්ෂණ

(අ) 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.9,624,111 ක් වූ ශිෂ්‍යත්ව අරමුදල් 22 ක් වර්ෂ 03 සිට වර්ෂ 11 ක කාලපරිච්ඡේදයක සිට කිසිදු ශිෂ්‍යත්වයක් පිරිනැමීම සඳහා උපයෝජනය කර නොතිබුණි. තවද 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.3,356,683 ක් වූ අක්‍රීය තත්ත්වයේ පැවති ශිෂ්‍යත්ව අරමුදල් 22 ක් යොදාගෙන "සම්මාන හා ශිෂ්‍යත්ව" ලෙස නව ගිණුමක් ආරම්භකර තිබුණු නමුත් ඉන් ශිෂ්‍යත්ව පිරිනැමීමට නිර්ණායක සකස් කර නොතිබියදී තවත් රු.10,000,000 ක් සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලින් එම ගිණුමට මාරුකර තිබුණි.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.9,097,939 ක් වූ විශ්වවිද්‍යාලීය පාඨමාලා හා දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල් 29 ක්, වර්ෂ 03 සිට වර්ෂ 04 දක්වා වූ කාලයක් තුළදී එම අරමුදල් පිහිටුවීමේ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

(ඇ) අධ්‍යයන නිවාඩු ලබා විදේශගතවූ ආචාර්යවරුන් 36 දෙනෙකුගෙන් ගිවිසුම් හා බැඳුම්කර කඩකර නිවීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.55,348,324 ක් අයවිය යුතුව පැවති අතර එහි වසර 25 ක් ඉක්මවා තිබුණු ආචාර්යවරු 09 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.5,826,865 ක් විය.

(ඈ) 2021 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්යමණ්ඩලයේ පවතින ආචාර්යවරුන්ගේ පුරප්පාඩු 228 ක් වෙනුවෙන් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගෙන සමාලෝචිත වර්ෂය සඳහා රු.30,996,109 ක දීමනා ගෙවා තිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලයේ විවෘත හා දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය මගින් සම්බන්ධීකරණය කරනු ලබන BIT පාඨමාලාව සඳහා පෞද්ගලික ආයතන සමඟ එළඹී ගිවිසුම්වලට අනුව එක් එක් ආයතනය විසින් බඳවා ගත යුතු අවම ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා නොගැනීම හේතුවෙන් පෞද්ගලික ආයතන දෙකකින් විශ්වවිද්‍යාලය වෙත අයවිය යුතු රු.8,255,000 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලය මගින් විශ්වවිද්‍යාලයෙන් පරිභාහිර පාර්ශව වෙත ඉංජිනේරු උපදේශන සේවා සපයා සමාලෝචිත වර්ෂය තුළ රු.292,585,898 ක ආදායම් ජනනය කර තිබුණද, විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ කෙරීගෙන යන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා උපදේශන සේවා බාහිර පාර්ශවයන්ගෙන් ලබාගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.7,359,395 ක් වැයකර තිබුණි.

(උ) 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.2,775,690 ක් වූ ටෝනර් හා කාට්රේජ් (Toner & Cartridge) තොගයක් ඌන උපයොජිතව පැවතුණි.

(ඌ) 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 සිට වර්ෂ 07 දක්වා කාලයක් ගතවී තිබුණු එකතුව රු.2,398,749 ක් වූ ණයගිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2017 සහ 2018 වර්ෂවල ආරම්භ කර තිබුණු හා 2021 දෙසැම්බර් 31 දින වන විට නිම කළ යුතු දිනය ඉකුත්වී තිබුණු පර්යේෂණ 14 ක් සඳහා රු.17,135,136 ක් වැය කර තිබුණු නමුත්, 2021 දෙසැම්බර් 31 දින වන විට එම පර්යේෂණ නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) 2021 දෙසැම්බර් 31 දිනට රු.1,680,174 ක් වූ සැපයුම්කරුවන්ගෙන් අයකර නිබුණු රැඳවුම් මුදල් වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති.

අංක 306/72, පොළොන්නරු පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொலன்னறுவை வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
மொறட்டுவைப் பல்கலைக்கழகம், இலங்கை
University of Moratuwa, Sri Lanka

මගේ යොමුව/எனது இல/**My Ref:** ඔබේ යොමුව/உமது இல/**Your Ref:** දිනය/திகதி/**Date:** 2022.09.06

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක.306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

<u>මොරටුව විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක එච්.ඊ.ඩී./සී/යු.ඔ.එම්/6/21/එන්ඒ හා 2022 ජූලි 12 දිනැති විගණන වාර්තාව හා බැඳේ.

උක්ත වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් අපගේ පැහැදිලි කිරීම් අමුණා ඇත.

මහාචාර්ය එන්.ඩී.ගුණවර්ධන
උපකුලපති

පිටපත්:-
01. ලේකම් - මුදල් අමාත්‍යාංශය
02. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
03. සභාපති - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

මොරටුව විශ්වවිද්‍යාලය, බණ්ඩාරනායක මාවත, කටුබැද්ද, මොරටුව 10400, ශ්‍රී ලංකාව
மொறட்டுவைப் பல்கலைக்கழகம், பண்டாரநாயக்க மாவத்தை, கடுபெத்த, மொறட்டுவைப் 10400, இலங்கை
University of Moratuwa, Bandaranayake Mawatha, Katubedda, Moratuwa 10400, Sri Lanka

උප කුලපති/உப வேந்தர்/**Vice-Chancellor:** +94 112 651259
Fax: +94 112 651671
කාර්යාලය/காரியாலயம்/**Office:** +94 112650188, 2650301, 2650340, 2650441, 2650534
Fax: +94 112650622
www.mrt.ac.lk

මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
மொறட்டுவைப் பல்கலைக்கழகம், இலங்கை
University of Moratuwa, Sri Lanka

මගේ යොමුව/எனது இல/My Ref: ඔබේ යොමුව/உமது இல/Your Ref: දිනය/திகதி/Date: 2022.09.06

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
අංක 72/306
පොල්දූව පාර,
බත්තරමුල්ල.

<u>මොරටුව විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>

ජාතික විගණන කාර්යාලය විසින් යොමු කරන ලද අංක HED/C/UOM/6/21/FA හා 2022 ජූලි 12 දිනැති විගණකාධිපති වාර්තාව හා බැඳේ. එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් පහත පැහැදිලි කිරීම් ඉදිරිපත් කරමි.

2. 2.2.

(අ)

(i) <u>නඩත්තු අංශයේ අස්ථානගත භාණ්ඩ තොගය</u>

මෙම රු.793,088ක් වූ අගය ලබාගැනීමේ දී සඳහන් වී ඇති ඒකක මිල ගණන් බැලූ බැල්මට පවතින මිල ගණන් හා එකඟ නොවන බව පෙනේ.
තවද මෙම එකඟ විය නොහැකි ඒකක මිල ගණන්වල වටිනාකම් මුළු අගයට ප්‍රමාණාත්මකව බලපාන බවද පෙනේ. උදා :

අනු අංකය	අමුද්‍රව්‍ය වර්ගය	ඒකක	පොත් අගය 2021.12.31	භෞතික අගය 2021.12.31	පොත් අගය හා භෞතික අගය අතර වෙනස	ඒකකයක මිල Rs.	ඌණතාවය Rs.
Building Items							
41	Tintex Nail	g	1399	1200	199	250.00	49,750.00
Electrical Items							
1	1.044 Brown Wire ($1mm^{2)}$	m	144	6	138	1,745.84	240,925.92

ඉහත පරිදි Tintex ඇණ ග්‍රෑම් .1ක් රු250ක් ලෙස හා 1. 044Brown Wire ($1mm^2$) මීටරයක් රු .1,745.84කට අගය කර ඇත.
එබැවින් මේ පිළිබඳව තවදුරටත් සොයා බලා පිළිතුරු ලබා දීමට පියවර ගන්නා බව කාරුණිකව දන්වමි.

මොරටුව විශ්වවිද්‍යාලය, බණ්ඩාරනායක මාවත, කටුබැද්ද, මොරටුව 10400, ශ්‍රී ලංකාව
மொறட்டுவைப் பல்கலைக்கழகம், பண்டாரநாயக்க மாவத்தை, கடுபெத்த, மொறட்டுவைப் 10400, இலங்கை
University of Moratuwa, Bandaranayake Mawatha, Katubedda, Moratuwa 10400, Sri Lanka

උප කුලපති/உப வேந்தர்/Vice-Chancellor: +94 112 651259 Fax: +94 112 651671
කාර්යාලය/காரியாலயம்/Office: +94 112650188, 2650301, 2650340, 2650441, 2650534 Fax: +94 112650622
www.mrt.ac.lk

මේ වන විට භාණ්ඩ ඌණතා සම්බන්ධව ප්‍රධාන ගිණුම් නිලධාරියා වන අමාත්‍යාංශ ලේකම් විසින් මේ සඳහා විධිමත් විනය පරීක්ෂණයක් කිරීමට තීරණය කර ඇති බැවින් එය නිම කිරීමන් අනතුරුව නිර්දේශ ක්‍රියාත්මක කරනු ලැබේ.

(ii) මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු නොකළ තැන්පතු මුදල්

2021 දෙසැම්බර් 31 දිනට රු. 10,249,876.00 ක තැන්පතු තුල පහත උප තැන්පතු ඇතුලත් වේ.

Tender Deposit/Canteen Deposit/ Security Deposit/ B.D. Bond Deposit

මෙම තැන්පතු නිදහස් කිරීම සඳහා අදාල තැන්පතුවේ මුල් පිටපත සහිතව අදාල තැන්පතු තබන ලද පුද්ගලයා විසින් ඉල්ලීමක් කල යුතුය. එහෙත් 2020 වර්ෂයේ සිට පැවැති කොවිඩ් වසංගත තත්වය මත එම තැන්පතු නිදහස් කර ගැනීම සඳහා ඉල්ලිම් නොලැබීම හේතුවෙන් මෙම තැන්පතු නිදහස් කර නොමැත. ඒ අනුව මෙම නිදහස් නොකරන ලද තැන්පතු සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් දැනුවත් කොට ඉදිරියේ දී අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

Sundry Deposit

බැංකුව වෙත සෘජුවම තැන්පත් කල තැන්පතු අතරින් හඳුනාගත නොහැකි වූ තැන්පතු විවිධ තැන්පතු ගිණුමේ සටහන් කර ඇති අතර ඒවා හඳුනා ගැනීමෙන් පසු අදාල ගිණුම් වලට බැර කරනු ලබයි. 2020 වර්ෂයේ සිට පැවැති කොවිඩ් වසංගතය තත්වය මත මෙම ගිණුමේ පැවති සමහර ශේෂයන් හඳුනා ගැනීම සඳහා කාලයක් ගත වී ඇත. කෙසේ වෙතත් මෙම තැන්පතු සම්බන්ධයෙන් කඩිනමින් සොයා බලා නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

Laboratory and Library Deposit

විශ්වවිද්‍යාල ප්‍රතිපත්ති අනුව පුස්තකාල හා විද්‍යාගාර තැන්පතු වසර 05 ක් තුල නිදහස් කරගෙන නොමැතිනම් ඒවා "Laboratory and Library Deposit Reserve Account" ගිණුමට මාරු කරනු ලැබේ. කෙසේ වෙතත් ඉදිරියේදී සිසුන් ලියාපදිංචියේ දී පුස්තකාල හා විද්‍යාගාර තැන්පතු පාඨමාලා අවසන් දිනයේ සිට වසර 02 ක් තුල නිදහස් කර ගත යුතු බවට කොන්දේසියක් ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) අධ්‍යයන කාර්ය මණ්ඩල පැමිණීම පිටවීම සටහන් කිරීම

මුළු විශ්වවිද්‍යාල පද්ධතිය තුළම සිදුවන්නේ මෙම ක්‍රමවේදය වන බැවින් මොරටුව විශ්වවිද්‍යාලය තුල ද එම ක්‍රමවේදය ක්‍රියාත්මක බව කාරුණිකව දන්වමි.

(ඇ) ස්ථාවර වත්කම් ලේඛණයක් විගණනය සඳහා ඉදිරිපත් නොවීම

විශ්වවිද්‍යාලය විසින් පරිගණකගත ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන යනු ලබයි. එහි මුද්‍රිත පිටපතක් ලබා ගැනීම සඳහා අධික පිරිවැයක් වැය වන බැවින් මුදල් අංශය සතු පරිගණකගත ස්ථාවර වත්කම් ලේඛණයට ප්‍රවේශ වී අදාල පරීක්ෂාවන් සිදු කල හැකි බව දන්වමි. කෙසේ වෙතත් අදාල මෘදුකාංග පද්ධතිය සතු ආයතනය හා CITEs මධ්‍යස්ථානය හරහා එම පරිගණකගත ස්ථාවර වත්කම් පද්ධතියට සෘජුවම ප්‍රවේශ වීමේ පහසුකම් සැපයීමට කටයුතු කරනු ලැබේ.

මොරටුව විශ්වවිද්‍යාලය, බණ්ඩාරනායක මාවත, කටුබැද්ද, මොරටුව 10400, ශ්‍රී ලංකාව
மொறட்டுவைப் பல்கலைக்கழகம், பண்டாரநாயக்க மாவத்தை, கடுபெத்த, மொறட்டுவைப் 10400. இலங்கை
University of Moratuwa, Bandaranayake Mawatha, Katubedda, Moratuwa 10400, Sri Lanka

උප කුලපති/உப வேந்தர்/Vice-Chancellor: +94 112 651259 Fax: +94 112 651671
කාර්යාලය/காரியாலயம்/Office: +94 112650188, 2650301, 2650340, 2650441, 2650534 Fax: +94 112650622
www.mrt.ac.lk

2.3

(අ) <u>අක්‍රිය තත්වයේ පවතින ශිෂ්‍යත්ව අරමුදල්</u>

මෙම අක්‍රිය තත්වයේ පවතින ශිෂ්‍යත්ව අරමුදල් සම්බන්ධයෙන් විස්තරාත්මකව සොයා බැලීම සඳහා සුභසාධක අංශයට සහ විභාග අංශයට උපදෙස් ලබා දී ඇත. එමෙන්ම මේ වන විට සම්මාන හා ශිෂ්‍යත්ව අරමුදලින් අවශ්‍ය ශිෂ්‍යත්වයන් ප්‍රදානය කිරීමට අවශ්‍ය නිර්නායකයන් සැකසීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර මේ වන විට මෙහි කටයුතු සිදුවෙමින් පවති. තවද 2021 වර්ෂයේ විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලින් රු. 10,000,000 ක් මෙම ශිෂ්‍යත්ව අරමුදල වෙත මාරු කර ඇත්තේ පාලක සභාවේ දී ගන්න ලද තීරණය අනුව බව ද දන්වමි.

(ආ) <u>දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල්</u>

මෙම දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල් සඳහා මුදල් ලැබෙනුයේ අදාල දෙපාර්තමේන්තු විසින් ස්වයං ඉපයීම් පදනම මත සිදු කරනු ලබන විවිධ පාඨමාලා/ පර්යේෂණ සහ උපදේශන සේවා මඟිනි. එහිදී අදාල අංශ ප්‍රධාන විසින් හඳුනාගනු ලබන කාර්යය මණ්ඩල හා ශිෂ්‍ය සංවර්ධන ක්‍රියාකාරකම්, විද්‍යාගාර හා දෙපාර්තමේන්තු උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් මෙම අරමුදල් භාවිතා කරනු ලබයි. මෙම අරමුදල් එක් වර්ෂයක් හෝ වර්ෂ කිහිපයක් අක්‍රියව පැවතියත් ඒවා ඉදිරියේදී අදාල කාර්යයන් සඳහා භාවිතා කරනු ලබයි. ඒ අනුව මෙම දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල් අදාල දෙපාර්තමේන්තු වැඩි දියුණු කිරීම් වෙනුවෙන් හා අනාගත අවශ්‍යතාවයන් වෙනුවෙන් ස්වයං ඉපයීම් කටයුතු මඟින් උත්පාදනය කරනු ලබන ආදායමින් සංචිතයක් ලෙස තබා ගන්නා අරමුදලකි. මෙම අරමුදල් නිශ්චිත කාලයක් තුළ වැය කළ යුතුවන බාහිර ආයතනයක් විසින් සපයන ලද අරමුදල් නොවන බැවින් ඒවා වර්ෂ කිහිපයක් වියදම් නොකර සංචිතයක් ලෙස තබා ගැනීමේ ගැටලුවක් නොමැති බව පෙනී යයි. එමෙන්ම 2020 හා 2021 වර්ෂයේ රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ මාස කිහිපයක් විශ්වවිද්‍යාලය සම්පූර්ණයෙන්ම වසා තිබීමත්, අනෙකුත් මාස වලද අධ්‍යනාංශ පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවීමත් හේතුවෙන් මෙම අරමුදල් 2020 හා 2021 වර්ෂයේ අක්‍රියව පැවතීමට හේතු විය.

එමෙන්ම පාඨමාලා සංවර්ධන අරමුදල් සඳහා මුදල් ලැබෙනුයේ අදාල දෙපාර්තමේන්තු විසින් ස්වයං ඉපයීම් පදනම මත මෙහෙයවනු ලබන පාඨමාලා තුළින් උත්පාදනය කරනු ලබන ආදායම් මඟිනි. එහිදී මෙම පාඨමාලාවන් වැඩිදියුණු කිරීම වෙනුවෙන් හා අනාගත අවශ්‍යතාවයන් වෙනුවෙන් සංචිතයක් ලෙස අදාල පාඨමාලා තුළින් උපයනු ලබන ආදායමින් කොටසක් මෙලෙස පාඨමාලා සංවර්ධන අරමුදල් ලෙස පවත්වා ගෙන යනු ලබයි. එමෙන්ම මෙම අරමුදල් අනවශ්‍ය දෑ සඳහා වියදම් නොකර අවශ්‍යතාවන් පැන නඟින තෙක් රඳවා තබා ගැනීම තුළින් එම පාඨමාලාවන් සඳහා මෙන්ම විශ්ව විද්‍යාලයේද මූල්‍ය ශක්තිය වර්ධනය වීමට හේතු වනු ඇත.

තවද, මෙම මුදල් අදාල වර්ෂව තුළම භාවිතා කිරීමට පෙළඹවීම මඟින් අර්ථවත් නොවන නිශ්ඵල කාර්යයන් සඳහා වැය කිරීමේ වඩාත් නැඹුරුවක් ඇති වීමට ඉඩ කඩ ඇත.

(ඇ) <u>අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ ආචාර්යවරුන් ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීම</u>

අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ ආචාර්යවරුන් 35 දෙනෙකුගෙන් ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීම හේතුවෙන් රු. 55,162,549.95 ක මුදලක් 2021 දෙසැම්බර් 31 දිනට අය වීමට තිබුණු අතර ඉන් ආචාර්යවරුන් 8 දෙනෙකු ගෙන් අය වීමට තිබූ මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කර ඇත. තවත් ආචාර්යවරුන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු මුදල් ප්‍රමාණය සඳහා ඔවුන්ට අයත් අර්ථසාධක අරමුදල් ප්‍රමාණවත් බැවින් එය අර්ථසාධක අරමුදලින් අයකර ගැනීම සඳහා කටයුතු කෙරෙමින් පවතී.

ඉන් තවත් ආචාර්යවරුන් 7 දෙනෙකු විසින් ඔවුන්ගෙන් අය විය යුතු මුදල්. වාරික වශයෙන් ගෙවමින් පවතී. ගිවිසුම් හා බැදුම්කර කඩකර වසර 25 ක් ඉක්මවා ඇති ආචාර්යවරුන් 9 දෙනාගෙන් 8 දෙනෙකු සඳහා නීතිමය කටයුතු සිදු කරමින් පවතින අතර අනෙක් ආචාර්යවරයාගෙන් අයත් අයවීම් අර්ථසාධක අරමුදලින් අයකර ගැනීම සඳහා කටයුතු කෙරෙමින් පවතී.

(ඇ) <u>බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගැනීම</u>

අදාල තනතුර සඳහා සුදුසුකම්ලත් ඉල්ලුම්කරුවන් ඉල්ලුම්කර නොමැති වීමෙන් අදාල පුරප්පාඩු පිරවීමට නොහැකි වන අතර එවිට අධ්‍යන කටයුතු අබාණ්ඩව පවත්වාගෙන යාම සඳහා බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගැනීමට සිදුවේ.

(ඉ) <u>BIT පාඨමාලාවට අදාලව පෞද්ගලික ආයතනවලින් අයවිය යුතු මුදල්</u>
අදාල මුදල් අයකර ගැනීමට නීති මගින් කටයුතු කරමින් පවතී.

(ඊ) <u>බාහිර පාර්ශවයන්ගෙන් උපදේශන සේවා ලබා ගැනීම</u>
බාහිර පාර්ශවයන් වෙත උපදේශන සේවා සැපයීමේ දී අදාල කාර්ය මණ්ඩලය විශ්ව විද්‍යාල රාජකාරිවලට අමතරව රාජකාරී වේලාවෙන් පරිබාහිරව මෙම සේවා සපයනු ලැබේ.
ඒ අනුව බාහිර පාර්ශවයන්ගෙන් ලැබෙන මුදල් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිශන් සභා චක්‍රලේඛ අංක 4/2016 පදනම් කොටගෙන පාලක සභාවෙන් අනුමත ක්‍රමවේදයක් මත අදාල කාර්ය මණ්ඩලයට ගෙවීම් කරනු ලැබේ.
විශ්ව විද්‍යාලයේ උපදේශන කාර්යයන් සඳහා අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට ගෙවීම් කිරීමට රජයේ මුදල් යෙදවිය නොහැකි බැවින් ආචාර්ය මණ්ඩලයට පැවරී ඇති රාජකාරිවලට පරිබාහිරව ඔවුන් විශ්ව විද්‍යාලයේ උපදේශන සේවා වලට යොදාගත නොහැක.
එසේ වුවද ඔවුන් මෙවැනි උපදේශන සේවා ලබාදුන වැඩ සඳහා උදා : ගොඩනැගිලි ආදිය සඳහා උපකුලපති මගින් අභ්‍යන්තර කාර්ය මණ්ඩල කමිටුවල සාමාජිකයින් ලෙස පත්කරනු ලබන අතර හැකිපමණින් ඔවුන්ගේ දායකත්වය නොමිලේ ලබාදෙනු ලැබේ. උපදේශන සේවාවන් සම්බන්ධව වගකීම හා වගවීම සම්බන්ධව බාහිර පාර්ශවයන් සමඟ ගිවිසුම්වලට එළඹෙනු ලැබේ. නමුත් අභ්‍යන්තර කාර්යමණ්ඩල සමඟ එවැනි ගිවිසුම්වලට එළඹීමට හැකියාවක් නොමැත.

(උ) <u>ඌණ උපයෝජිතව පැවති ටෝනර් හා කාට්රේජ්</u>
ටෝනර් හා කාට්රේජ් ඉදිරියේ දී එවා අවශ්‍ය අංශයන් හඳුනා ගෙන නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. තවද විශ්වවිද්‍යාලයට අවශ්‍ය ටෝනර් හා කාට්රේජ් මිලදී ගැනීමේ දී මෙලෙස අතිරික්තයන් ඇති නොවන පරිදි මිලදී ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගෙන ඇත.

(ඌ) <u>ණයහිමි ශේෂ නිරවුල් කිරීම</u>
සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීමේදී එම භාණ්ඩ පිළිබඳව තත්ව වාර්තාව අදාල දෙපාර්තුමේන්තුවේ හෝ අංශයේ ප්‍රධානියාගේ නිර්දේශය මත සැපයුම් අංශයට ඉදිරිපත් කල යුතු අතර ඉන් පසුව සැපයුම් අංශය එම භාණ්ඩයට අදාල ඇණවුම, භාණ්ඩ ලැබීමේ පත්‍රිකාව හා ඉන්වොයිසිය පරීක්ෂා කර නිරවද්‍යතාවය තහවුරු වූ පසු ඊට අදාල වවුචර්පත් සකසා මුදල් අංශය වෙත එවනු ලැබේ.

එහෙත් එම ලියවිලි වල යම් අඩුපාඩුවක් පැවතිය හොත් ඒවා සඳහා ගෙවීම් කිරීමේ හැකියාවක් නොමැත. ඒ අනුව මෙම නිරවුල් නොකළ ණයගිමි ශේෂයන් සම්බන්ධයෙන් විස්තරාත්මකව සොයා බලා ඒවා නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

(ඒ) <u>නිමකර නොමැති පර්යේෂණ ප්‍රධාන</u>
මේ සම්බන්ධ ප්‍රගතිය ඇමුණුමෙහි දක්වා ඇත. (ඇමුණුම 01)

(ඒ) <u>සැපයුම්කරුවන්ගෙන් රඳවා ගන්නා ලද මුදල්</u>
සැපයුම්කරුවන්ගෙන් රඳවා ගන්නා ලද මුදල් ශේෂයෙන් වසර 01 සිට වසර 05 දක්වා කාලයක් ගතවී ඇති නිරවුල් නොකළ ශේෂයන් සම්බන්ධයෙන් සොයා බලා ඒවා නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

මහාචාර්ය එන්.ඩී ගුණවර්ධන
උපකුලපති

මොරටුව විශ්වවිද්‍යාලය, බණ්ඩාරනායක මාවත, කටුබැද්ද, මොරටුව 10400, ශ්‍රී ලංකාව
மொறட்டுவைப் பல்கலைக்கழகம், பண்டாரநாயக்க மாவத்தை, கடுபெத்த, மொறட்டுவைப் 10400, இலங்கை
University of Moratuwa, Bandaranayake Mawatha, Katubedda, Moratuwa 10400, Sri Lanka

උප කුලපති/உப வேந்தர்/Vice-Chancellor: +94 112 651259
Fax: +94 112 651671
කර්යාලය/காரியாலயம்/Office: +94 112650188, 2650301, 2650340, 2650441, 2650534
Fax: +94 112650622
www.mrt.ac.lk

Details of Grant in 2017 and 2018

No.	Name of the Lecturer	Research Grant Number	Curent Status
1	Mr. V Sivahar	SRC/LT/2017/24	Grant is not closed
2	Dr. PCP De Silva	SRC/LT/2017/22	Grant is not closed
3	CH. QS HS Jayasena	SRC/LT/2017/20	Grant is not closed
4	Dr. HKG Punchihewa	SRC/LT/2017/17	A progress report has been submitted for the period from 02.11.2019 to 01.05.2022 on 05.08.2022
5	Dr. (Ms). JVUP Jayathunga	SRC/LT/2017/16	Grant is not closed
6	Dr. (Mrs). ATP de Silva	SRC/LT/2017/15	Grant is not closed
7	Prof. GIUS Perera	SRC/LT/2017/12	Grant is not closed
8	Dr.K Hemachandra	SRC/LT/2017/10	Completed & closing will be considered at next SRC meeting on 25 August 2022.
9	Ch.Qs. HS Jayasena	SRC/LT/2018/12	Grant is not closed
10	Prof. W.D.G. Lanarolle	SRC/LT/2018/09	Received a report of the last Progress Review held on 17.06.2022
11	Dr. A.S. Perera	SRC/LT/2018/08	Grant is not closed
12	Prof. C.S. Lewangamage	SRC/LT/2018/07	Grant is not closed
13	Dr. C.S.A. Siriwardana	SRC/LT/2018/06	Time Extended. New completion dateis 31 July 2022
14	Dr. M.J. Walpola	SRC/LT/2018/04	Grant is not closed



UNIVERSITY OF MORATUWA, SRI LANKA

ANNUAL REPORT & STATEMENT OF ACCOUNT 2021

සාමාන්‍ය පාලන අංශය, මොරටුව විශ්වවිද්‍යාලය.

பொதுநிர்வாகப் பிரிவு, மொறட்டுவைப் பல்கலைக்கழகம்.

General Administration Division, University of Moratuwa.